චතුරාර්ය සත්‍යය අවබෝධයට ධර්ම දේශනා

මහමෙව්නා

සදහම් ප්‍රකාශන

53

# නුවණැත්තෙක් වෙන්නට නම්...

- පරිවීමංසන සූත්‍රය
- පටිපන්න සූත්‍රය

පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

මහමෙව්නා සදහම් ප්‍රකාශන - 53

# නුවණැත්තෙක් වෙන්නට නම්....

ශ්‍රී බු.ව. 2550 ක් වූ දුරුතු මස

© පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

**පරිගණක අකුරු සැකසුම,**
**පිටකවර නිර්මාණය සහ ප්‍රකාශනය**

---

මහමෙව්නා සදහම් ප්‍රකාශන

මහමෙව්නා භාවනා අසපුව
වඩුවාව, පොල්ගහවෙල.

දුර / ෆැක්ස් : 037 2244602
ඊ මේල් : asapuwa1@sltnet.lk
වෙබ් අඩවිය : www.mahamevna.org
www.gautamabuddha.org

**මුද්‍රණය**

---

ඉලේෂන් ඔෆ්සෙට් (පුද්.) සමාගම

කටුනායක ගුවන්තොටුපල,
මිනුවන්ගොඩ පාර, ආඬිඅම්බලම.

දුර : 011 2254490 / 2254636

# පරිවීමංසන සූත්‍රය

## (නුවණින් විමසීම ගැන වදාළ දෙසුම)

*සංයුත්ත නිකාය 2 (දුක්ඛ වර්ගය)*

# පරිවීමංසන සූත්‍රය

නමස්කාර වේවා බුදු රුවනට සැම දා බුදු හිමි සරණ යම්
නමස්කාර වේවා දම් රුවනට සැම දා සඳහම් සරණ යම්
නමස්කාර වේවා සඟ රුවනට සැම දා මහ සඟ සරණ යම්
නමස්කාර වේවා තුනුරුවනට සැම දා තිසරණ සරණ යම්

## ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

අපි ඉගෙනගෙන තියෙනවා තෙරුවන් සරණ ගිහින් ගෞතම බුද්ධ ශාසනය තුළට ශ්‍රාවකයෙක් හැටියට පිවිසෙන කොට අපට පිහිටන ඉන්ද්‍රිය පහක් ගැන. ඒ පහ තමයි ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, ප්‍රඥා. මේ ඉන්ද්‍රිය ධර්ම දියුණු කරගෙන අපි ශ්‍රද්ධාවේ පිහිටල, වීරිය ඇති කරගෙන, සිහිය දියුණු කරල, සමාධිමත් සිතක් තුළින් ප්‍රඥාව දියුණු කරගෙන, ආර්ය සත්‍ය අවබෝධය කරායන්න වුවමනා වෙලා තිබෙන්නෙ, අපිට මේ මුණ දෙන්ට තිබෙන දුක් දොම්නස් වලින් අත්මිදීම පිණිස යි. අපිව මෙච්චර දීර්ඝ සංසාරෙක පැටලි පැටලි ආවෙ බාහිර කෙනෙක් විසින් කරපු දෙයක් නිසා නොවෙයි. තමාගේ කැමැත්තෙනුත් නොවෙයි. ඉබේත් නොවෙයි. මෙතන සිදුවීම් මාලාවක් සිද්ධ වෙවී යනව. අන්න ඒ සිදුවීම් මාලාව දිගින් දිගට ම සිදු වෙච්ච නිසයි අපිට සතර මහා සාගරයටත් වඩා මවුකිරි බිබී, මේ සංසාරෙ ඉන්න සිද්ධ

වුනේ. මේක සැප සහිත තැනක් නම්, බුදුරජාණන් වහන්සේලා කවදාවත් පහළ වෙන්නෙ නෑ. බුදුරජාණන් වහන්සේලා පහළවෙන්නෙ, මේ සංසාර ගමනෙන් අත් මිදෙන්න කරන මහා වීරියේ ප්‍රතිඵලයක් හැටියට යි.

## පෘතග්ජනයන්ට නැත කිසි රැකවරණා...

එතකොට බුදු කෙනෙක් පහළ වෙලා ලෝකෙට කියලා දෙන්නෙ ආයෙ ආයෙමත් උපදින්න නොවෙයි. අනිත් එක මේ උපදින සත්වයා නිරයේ යන්නෙ නැත්නම්, තිරිසන් ලෝකෙ උපදින්නෙ නැත්නම්, ප්‍රේතයෙක් වෙන්නෙ නැත්නම්, අපාගත වෙන්නෙ නැත්නම්, අන්න රැකවරණයක් තියෙනව. එහෙම රැකවරණයක් ආර්ය ශ්‍රාවක භාවය නොලැබූ පෘථග්ජන සත්වයාට නැහැ.

## පමා නොවී යමු හනිකට අරි අටැඟි මගේ...

බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියෙනව, ශ්‍රද්ධානුසාරී අය ගැන, “සබ්බේ තේ සග්ග පරායනා”. ඒ සියව්දෙනා ස්වර්ග ගාමී වෙනව. ශ්‍රද්ධානුසාරි වෙච්ච කෙනෙකුට එතකොට ස්වර්ගයේ උපතක්, සුගතියේ උපතක් තියෙනව. නමුත් ඒකෙ නැහැ මේ සතර අපායෙන් අත්මිදිල කියල. සතර අපායෙන් අත්මිදෙන්නේ සෝතාපත්ති ඵලය සාක්ෂාත් කිරීමෙන් ම යි. එහෙම නම් අපි ශ්‍රද්ධානුසාරී වීමෙන් රැකවරණයක් තියෙනව. මොකක් ද රැකවරණය. එයා හදිසියේවත් මැරුණොත් ධර්මය අවබෝධ කරන්න බැරි තැනක් කරා යන්නෙ නෑ. ආයෙමත් අවස්ථාවක් ලැබෙනව. නමුත් අපි කල්පනා කළ යුත්තේ ශ්‍රද්ධානුසාරී වෙලා ඉන්න නොවේ. ධම්මානුසාරී

වෙලා, ඊළඟට සෝතාපන්න වීමට යි. සෝතාපන්න වෙච්ච එක්කෙනා කල්පනා කරන්න ඕනෙ, සකෘදාගාමී වීමට යි. සකෘදාගාමී වෙච්ච එක්කෙනා කල්පනා කරන්න ඕනෙ, අනාගාමී වීමට යි. අනාගාමී වෙච්ච පැවිදි කෙනා කල්පනා කරන්න ඕනෙ අරහත්වයට පත් වීමට යි. මොකද හේතුව? මේ සංසාර ගමනේ රැඳී සිටීමෙන් අමුතු වාසියක් අමුතු ලාභයක් කෙනෙකුට ලැබෙන්නෙ නෑ. අනිත්‍ය දේට අපි කවදා නමුත් මූණ දෙන්ට ඕනෙ.

## ඒ එක ම එක්කෙනා ඔබ නම්... ඔබ වාසනාවන්තයි

බුදුරජාණන් වහන්සේගෙන් භික්ෂූන් වහන්සේ නමක් අහනවා, "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, කල්පයකට අවුරුදු කීයක් තියෙනව ද?" කියල. අහන කොට බුදු රජාණන් වහන්සේ වදාළා "පින්වත් භික්ෂුව, ඒක අවුරුදු වලින් කියන්න බැහැ. අවුරුදු සීය යි, දාහ යි, ලක්ෂය යි කියල කියන්න බැහැ" කියල. "එහෙම නම් උපමාවක් දේශනා කරන්න පුළුවන් ද?" කියල ඇහුව. "පුළුවන්" කිව්ව. කියල බුදුරජාණන් වහන්සේ වදාළා, "පින්වත් භික්ෂුව, ගංගානං ගඟ පටන් ගන්න තැන ඉඳල මහ මුහුදට වැටෙන තැන දක්වා, ඒ දීර්ඝ ගංගාවෙ සියළු වැලි කැට ගණන් කළත් කල්පය ඉවර වෙන්නෙ නෑ." කියල. එතකොට එබඳු කාල පරිච්ඡේද කී කෝටියක් අපි ගෙවල ද මේ ඉන්නෙ. අපිට වුවමනා කරන්නෙ එක දෙය යි. බුදුරජාණන් වහන්සේ වදාළ දෙය ඇත්තක් ම යි. මේ ගමන හැදිල තියෙන්නෙ මෙහෙම යි. මේකෙ තියෙන්නෙ භාරදූර කර්තව්‍යයක්. භාරදූර වැඩක් අපට මේකෙ පැවරිලා තියෙන්නෙ. ඒ තමයි මේ ජීවිතේදී ම ඉක්මනට ධර්මය අවබෝධ කරගන්න එක. අන්න ඒ අවබෝධ කර

ගැනීමට වුවමන යි, නුවණින් විමසීම; බුද්ධිමත් ව විමසීම. නුවණින් කල්පනා කිරීම. අපි නුවණින් කල්පනා කරන්න එපා කීවත් බුද්ධිමත් කෙනා නුවණින් කල්පනා කරනව. නුවණින් කල්පනා කරන්නෙ නැති කෙනාට ඇඟිල්ලෙන් ඇන ඇන කීවත් නුවණින් කල්පනා කරන්නෙ නෑ ම යි. මේ නිසා බුද්ධිමත්ව නුවණින් කල්පනා කරන්න පුළුවන් එක්කෙනා මේ ධර්මය අවබෝධ කර ගන්නව. සමහර විට මෙතන ඉන්න දහස් සංඛ්‍යාත පිරිස අතර එක් කෙනෙක් නම්, එයා තමයි මේ ධර්මය අවබෝධ කරන්නෙ. එයා උදෙසා තමයි මම මේ ධර්මය කියන්නෙ. එයා කවුද දන්නෙ නෑ. සමහර විට එයා ඔබ වෙන්න පුළුවන්.

## ඔබ ශ්‍රේෂ්ඨත්වයට පත්වෙන්න කැමති ද? මෙන්න ක්‍රමය..

බුදු රජාණන් වහන්සේ වදාළ මේ දේශනාවෙ නම පරිවීමංසන සූත්‍රය. මේක සංයුක්ත නිකායේ දෙවෙනි කොටසේ දේශයක්. බුදුරජාණන් වහන්සේ මේ දේශනාව සැවැත් නුවර ජේතවනාරාමයේ දම්සභා මණ්ඩපයේ දී වදාළේ. ඉතින් දම් සභා මණ්ඩපයට රැස්වුන භික්ෂූන් වහන්සේලා ගෙන් බුදු රජාණන් වහන්සේ අහනවා, “පින්වත් මහණෙනි, ඔබ පරිවීමංසනයේ යෙදෙනවා ද?” කියල. පරිවීමංසනයෙ යෙදෙනවා කියල කියන්නෙ, ඔබ මනා කොට නුවණින් විමසීමක් කරනවා ද, මේ ජීවිතය ගැන? කුමන කරුණු මත ද මේ නුවණින් විමසීම සිදුවන්නේ කියල ඇහුව. බුදුරජාණන් වහන්සේ ඇහුවෙ සම්පූර්ණ ප්‍රශ්නයක්. මනා කොට දුක් අවසන් වන ආකාරයට, මේ තියෙන දුක් ගෙවිලා යන ආකාරයට, තණ්හාව ප්‍රහාණය වන ආකාරයට, අවිද්‍යාව දුරුවන ආකාරයට, පටිච්ච සමුප්පාදය නිරුද්ධ වෙන ආකාරයට,

ජාති- ජරා- මරණ- ශෝක- වැලපුම්- දුක් දොම්නස් උපායාස නිරුද්ධ වන ආකාරයට නුවණින් විමසීමක් කරනවා නම් ඔබ කරන්නේ කොහොම ද කියල ඇහුව.

## ඔබ ම යි අපට පිළිසරණ....

බුදුරජාණන් වහන්සේට ඒ ස්වාමීන් වහන්සේලා පිළිතුරු දුන්නා මෙහෙම. (භගවං මූලකා නො භන්තෙ ධම්මා) "භාග්‍යවතුන් වහන්ස, අපගේ මේ ධර්මය තියෙන්නෙ භාග්‍යවතුන් වහන්සේ මුල් කරගෙන යි." (භගවං නෙත්තිකා) "භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන කරගෙන යි." (භගවං පටිසරණා) "භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කරගෙන යි." "භාග්‍යවතුන් වහන්සේ ම මේ කරුණ අපට පැහැදිලි කර දෙන සේක්වා. අපි ඒ ධර්මය දරා ගන්නම්" දැන් එතකොට මේ බුදු රජාණන් වහන්සේ උපදේශයක් දෙනවා, නිවන් අවබෝධය පිණිස කල්පනා කළ යුතු ආකාරය ගැන.

දැන් මෙතනදි බුදු රජාණන් වහන්සේ රහසේ උගන්වනව ද කාටවත්? කමටහන් කියල දෙයක් මේකෙ නෑ. කමටහන් දෙනවා කියල එකක් ඔබ අහල තියෙනව ද? ඒ කමටහන් කියන ඒවා මේ ප්‍රසිද්ධයේ කියන ඒව ද? නෑ. කමටහන් කියන ඒවා කොහොම ද කියන්නෙ. හොරෙන් උගන්වන්නෙ. ළඟට අඬගහල කණට කරල මොනව ද අහනව. ඊට පස්සෙ කාරණයක් කියනව. මොකක් ද දන් නෑ. එතකොට එයත් මොකද කරන්නේ ඒ කාරණයට අනුව ගිහිල්ල භාවනා කරනව. භාවනා කරල ඇවිල්ල කම්මට්ඨානාචාරී කෙනා ගෙ කණට කරල කියනව, මේකයි මේකයි මං කළේ කියල. එතකොට අරය

කණට කරල කියනවා මෙහෙම කරන්ට මෙහෙම කරන්ට කියල. හොරෙන්. එහෙම ක්‍රමයක් මේ බුද්ධ ශාසනයෙ නැහැ.

## "බබලන්නට ඉඩහරින්න, රහස් එපා...."

දැන් බලන්න, බුදු රජාණන් වහන්සේ ගේ ධර්මයේ තියෙන්නේ කොහොම ද? ඉතා ම පිරිසිදු ඉතා ම පිවිතුරු, ඇවිත් බලන්න කියල විනෙ කෙනෙකුට කියන්න පුළුවන්, එළිපිට කතා කරන ධර්මයක්. උන් වහන්සේ ධර්මය උපමා කළේ හිරු මඬලට, සඳ මඬලට. උන්වහන්සේ පෙන්වා දුන්නා මේ ලෝකෙ විවෘත වුනහම බබලන කරුණු තුනක් තියෙනව. මොනව ද ඒ? හිරු මඬල, සඳ මඬල, ශ්‍රී සද්ධර්මය. මේ තුන විවෘත වුනහම බබලනවා. සැඟවුනහම බබලන්නෙ නෑ. එතකොට හිරු මඬල වළාකුළු වලින් වැහුනොත්, මීදුමෙන් වැහුනොත්, දුමකින් වැහුනොත් බබලයි ද? බබලන් නෑ. සඳ මඬල වළාකුළු වලින් වැහුනොත්, මීදුමෙන් වැහුනොත්, දුමකින් වැහුනොත් බබලයි ද? නෑ. බුදු රජාණන් වහන්සේ ගේ ධර්මයත් එහෙම යි. මතවාද වලින් රහස් බණ වලින් වැහුණොත් බබලන් නෙ නෑ. ඇයි දන්නෙ නෑ. මොකක් ද ඒ භාවනාව? විශේෂ දෙයක් හොරෙන් උගන්වනව ද? ඒ විශේෂ දේ මොකක් ද? ඒ පුරුද්දට වැටුණ සමහරු, මගෙනුත් ඇවිල්ල බලාපොරොත්තු වෙනව. වෙන ම ඇවිල්ල මගෙත් එක්ක කතා කරනව. මම දැන් මෙහෙමයි, මෙහෙමයි කරන්නෙ. රහසෙ කියාගෙන යනකොට මම කියනවා, නෑ, මට තුණ්ඩු කැල්ලක් එවන්න කියල. ඒ මොකද ඒ? සියවි දෙනාට ම මේක දැන ගන්න විනෙ නිසා. එහෙම නම් අපිට රහස් බණ කතා කරල මේ ධර්මය නම් කවදාවත් අවබෝධ කරගන්න බෑ.

## “දෙගොඩතලා ගඟ ගලා - පනස් දාහක් මළා”

බුදු රජාණන් වහන්සේ මේ අරහත්වයට පත්වෙන ක්‍රමයක් දේශනා කරන්න සූදානම් වෙන්නෙ. බුදු රජාණන් වහන්සේ ඒ ස්වාමීන් වහන්සේලාට වදාළා, “පින්වත් මහණෙනි, එහෙනම් අහගන්න. ඔන්න දැන් මං කියා දෙනව” කියල. මේ විදිහට බුදුරජාණන් වහන්සේ ඒ ස්වාමීන් වහන්සේලාට ධර්මය දේශනා කරන්න පටන් ගත්ත. “මහණෙනි, භික්ෂුවක් මෙන්න මේ විදිහට නුවණින් විමසන්න පටන් ගන්න විනෙ.” ඔන්න දැන් පටන් ගන්න හැටි තියෙන්නෙ. අනේක විධ නානාප්‍රකාර වූ දුකක්. ජරා මරණ දුකක් මේ ලෝකයෙ ඇතිවෙනව. දැන් ඔබ දන්නවා ඇති ඊයෙ පෙරේදා ඔන්න භූමිකම්පාවක් ඇති වුනා. ඒකෙන් කී දාහක් මළා ද? පනස් දාහක් මළා. තව කොච්චර ඇත් ද අත පය කැඩිච්ච අය. ඔන්න මෙහෙ ගංවතුරක් ගැව්වා. දැන් ඔන්න ඉස්සරහට වහින පාටක් නැහැ. මොකක් වෙයි ද දන්නෙ නෑ. දැන් මේ කුඹුරු වගා කරපු අය ගේ ඔක්කොම ගොයම් මැරී ගෙන යනව. මොනව හරි කරදරයක් වෙනව. එක්කො යුද්ධයක් එනව. එක්කො ගං වතුරක් එනව. එක්කො පැවිල්ලක් එනව. එක්කො ඩෙංගු වගේ රෝගයක් එනව. නේද? මොකක්වත් නැති කාල පරිච්ඡේදයක් නෑ වගේ. හැමදාම දුක් කරදර. දැන් ඔන්න සීතලෙන් මැරෙනවා ඉන්දියාවෙ. පායන කාලෙට පැවිල්ලෙන් මැරෙනවා. ගංවතුරෙන් මැරෙනවා. මේ වගේ නානාප්‍රකාර දුක් දොම්නස් ගොඩක් විඳගෙන තමයි ඉන්නෙ.

## “දුක කියන්නෙ හදවත හදනා වූ පිළිලයක් ද? නැහැ. නැහැ.”

ඉතින් එයාට නුවණින් හිතන්න පටන් ගන්න කියනවා ඔන්න ඔතනින්. මේ ජරා මරණ දුකක් තිබෙනවා,

නානාප්‍රකාර විදිහට මේ ලෝකේ රෝග පීඩා හැදෙනවා. මේ ජරා මරණ දුක ලෝකයට උපදින්නෙ කොතනින් ද කියල හිතන්න කියනව. කුමක් හට ගැනීමෙන් ද මේ දුක හටගන්නෙ? කුමක් හේතු කරගෙන ද මේ දුක ඇතිවන්නෙ කියල හිතන්න පටන් ගන්න කියනවා අන්න එතනින්. දැන් අපේ ප්‍රශ්නෙත් ඒක ම නෙ. දැන් අපි වයසට යනව. කවුරුත් නොයෙක් රෝග පීඩා වලට ගොදුරු වෙනව. නොයෙක් කරදර කම්කටොළු වලට ගොදුරු වෙනව. නොයෙක් කායික දුක් වලට ගොදුරු වෙනව. නොයෙක් මානසික දුක් වලට ගොදුරු වෙනව. නොයෙක් සුසුම් හෙලීම්, ශෝක කිරීම්, පසු තැවිලි වීම්, මේ නානාවිධ අතවරයන්ට ගොදුරු වෙනව. හිතන්න පටන් ගන්න කියනවා මේ ජරා මරණ දුක ගැන. කොහොම ද හිතන්න පටන් ගන්න කියන්නෙ. මේ දුක හට ගන්නෙ කොතනින් ද? මොකෙන් ද මේ දුක හට ගන්නේ කියල හිතන්න පටන් ගන්න කියනව. ඒ විදිහට හිතන්න පටන් ගන්න කොට එයා මේ විදිහට කියනව, අවබෝධ කර ගන්නෙ.

## දෙවියන් වහන්සේට වැරදුනු තැන.

බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය තුළ නියම විදිහට හිතන්න කියන විදිහ බලන්න. වෙනත් මිත්‍යා ධර්ම තුළ උගන්වන්නේ එහෙම නෙවෙයි නෙ. මේක මැවුම්කාරයා ගෙ කැමත්ත, කරබාගෙන හිටපන්. එහෙමනෙ උගන්වන්නෙ. බුදු රජාණන් වහන්සේ ගේ ධර්මයේ තමයි හිතන්න උගන්වන්නෙ. අන්න බලන්න, බුද්ධියේ ද්වාරය විවෘත කරනවා. හිතන්න පටන් ගන්න කියනවා නිදහසේ. කොහෙන් ද මේක හටගන්නෙ කියල. අන්න එයා අවබෝධ කරගන්නවා. මේකට හේතුව මොකක් ද? ඉපදීම යි මේකෙ මුල.

## අහෝ! වත මයං න ජාති, ජරා, මරණං..... එපා....

ඉපදීමෙන් තමයි මේ දුක් දොම්නස් විඳින්නෙ. ඉපදීමෙන් තමයි මේ කායික දුක්, මානසික දුක්, කායික වේදනා, මානසික වේදනා, කායික පීඩා, මානසික පීඩා සියල්ල ම ඉපදීම නිසයි. මේක පිළිගන්නෙ නැති කෙනා උපතක් පතනවා කායික දුක් නැති, මානසික දුක් නැති. "අනේ උපනුපන් ආත්ම වල අපට නම් එපා ඔය ලෙඩ, අපිට නම් එපා ඔය වගේ දුක් කරදර, මට නම් උපනුපන් ආත්මෙක ලෙඩ වෙන්න විනෙ නෑ." එහෙම කියන අය නැද්ද? විනෙ තරම් ඉන්නව. ඒ කියන්නෙ එයා පතනවා ලෙඩ වෙන් නැති උපතක්. "අනේ මට නං උපන් ආත්මෙක වයසට යන්න නම් සිද්ධවෙන්න එපා" කියනව. එයා පතනවා නාකි නොවන උපතක්. "අපි නම් ඔය විදිහට මැරෙන්න එපා." එයා පතනවා මරණයක් නැති උපතක්. අන්න බලන්න එතන ම යි නිවැරදි වෙන්න තියෙන්නෙ. ඉපදුනා නම් ඒක තමයි ජරා මරණ වලට, දුක් දොම්නස් වලට, කායික දුක් වලට, මානසික් දුක්වලට, කායික පීඩා වලට, මානසික පීඩා වලට හේතුව. දැන් ගොඩක් දිවි නසා ගැනීම් සිද්ධවෙන්නෙ වැරදි කල්පනා නිසා ම යි. අපි හිතනවා මැරුණට පස්සෙ උපතක් නැද්දෝ කියල. මැරුණට පස්සෙ ඔක්කොම ඉවරයි නේ... දන්නෙ නෑනෙ කියල හිතනව. මොකද එයා හිතන්නේ. ආයෙ උපදින්නෙ නෑ කියල. නමුත් උපදිනව. එක්කෝ බිත්තරයක් අස්සේ, එක්කෝ මව් කුසක, එක්කෝ තෙත් පරිසරයක, එක්කෝ විපපාතිකව.

## අතරමං නොවෙමු පඹගාලේ

බුදු රජාණන් වහන්සේ දේශනා කළා "මහණෙනි, මෙසා දීර්ඝ සංසාරෙදි ඔබ ගවයන් වෙලා ඉපදිච්ච

අවස්ථා වල දී බෙලි කැපුම් පහර කද්දි ගලා ගිය ලේ දහරාව සතර මහා සාගරයේ ජලයට වඩා වැඩී. ඔබ එළුවන් වෙලා ඉන්දැද්දී, ඌරන් වෙලා ඉන්දැද්දී බෙලි කැපුම් කද්දි ගලා ගිය ලේ දහර මේ සතර මහා සාගරයේ ජලයට වඩා වැඩියි. ඔබ හොර හතුරන්ට අහුවෙලා මැරුම් කද්දී ගලාගෙන ගියපු ලේ, මේ සතර මහා සාගරයේ ජලයට වඩා වැඩියි කියල. එහෙම නම් අණ්ඩජ උපතක් කරා ගියත්, ජලාබුජ උපතක් කරා ගියත්, සංසේදජ උපතක් කරා ගියත්, ඕපපාතික උපතක් කරා ගියත් සිද්ධ වෙනවා අනන්ත දුක් විඳවන්න. ඉතින් මේ නිසා මෙයා මේක තේරුම් අරගෙන ජරා මරණ වලින් නිදහස් වෙන්න උත්සාහ කරනව.

දැන් ඔන්න ජරා, මරණ ගැන අවබෝධයක් එයාට තියෙනව. ජරා මරණ හටගන්නේ මක් නිසා ද, කුමකින් ද කියල අවබෝධයක් තියෙනව. ජරා මරණ හටගන්නේ කුමකින් ද? මේ සතර ආකාරයේ ඉපදීම නිස යි. එහෙම නම් මේ ජරා මරණයන් ගෙන් අපි නිදහස් වෙන්නෙ කවද්ද? මේ හතර ආකාරයේ ම උපත නැති වෙච්ච දවසට අපි නිදහස්. මේ හතර ආකාර උපත නැති වෙලා ජරා මරණ නිරුද්ධ වෙන්නෙ කවද්ද? ආර්ය අෂ්ඨාංගික මාර්ගය සම්පූර්ණ කරගත්තු දවසට. එහෙනම් මේ ජරා මරණ නිරුද්ධ වෙන්ට තියෙන මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. බලන්න කැරකිලා එන්නෙ කොහේට ද එයා? ආර්ය අෂ්ටාංගික මාර්ගයට යි. හරියට හිතුව නම් එයා ආර්ය අෂ්ටාංගික මාර්ගයට එනව. හරියට හිතුවෙ නැත්නම් පඹගාලෙ. එතකොට හරියට එයා කල්පනා කරනව නම් එයා කැරකි කැරකි එන්නේ කොහාට ද? මාර්ගයට යි පැමිණෙන්නෙ. එයා තමයි මාර්ග ඵල ලාභියෙක් වෙන්නෙ.

## තොරා ගැනීම ඔබ සතු යි.

ඊළඟට බුදු රජාණන් වහන්සේ වදාළා, මෙන්න මේ ක්‍රමයට හිතන එක්කෙනා සියළුම දුක් ක්ෂය වීම පිණිස ජරා මරණ නිරුද්ධ වීම පිණිස, මාර්ගයට බැස ගන්නව කියල. ඔන්න හිතන්න තියෙන ක්‍රමයක්. ඔබට මතකද මම මුලින් ම සඳහන් කළා මේක අල්ලන්නේ බුද්ධිමත් කෙනා කියල. බාහිර කෙනෙක් අපිට හිතන හැටි උගන්වනවා නම් උගන්වන්නේ මේ ධර්මයෙන් විතර ම යි. තමන් ම යි මේ හිතන ක්‍රමය, මේ ධර්මය තුළින් අල්ලගන්න ඕනෙ.

## මැවුම්කාරයා 'භවය' යි. දෙවිඳ, ඔබ නොවෙයි.

ඊට පස්සෙ බුදු රජාණන් වහන්සේ වදාළා එයාට තවදුරටත් හිතන්න කියනවා, මේ ඉපදීම සිදුවුනේ මක් නිසා ද කියල. ඇයි ඉපදුනේ? ඉපදීමේ මුල මොකක් ද? ඉපදෙන්න හේතුවෙච්ච කාරණය මොකක් ද? කුමක් හට ගැනීමෙන් ද මේ උපත හට ගන්නේ කියල. සිදුවීම් මාලාවක් දිහා බලන ආකාරයට මේ දිහා බලන්න කියනවා. නුවණින් මේක විමසන්න කියනවා. ඔන්න ඒ විදිහට විමසද්දි විමසද්දි එයා මෙන්න මෙහෙම අවබෝධ කර ගන්නවා. මේ ඉපදීමේ මුල භවය යි කියල. ඒකියන්නේ අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික කියන උපත හටගන්නෙ භවයක් හට ගැනීමෙනු යි. භවය හේතු කරගෙන යි. සතර ආකාරයට උපදින්නෙ මේ හේතුව නිසා කියල එයා නිවැරදිව දැක ගන්නවා. බලන්න මේ අවස්ථාව ලැබෙන්නෙ මේ ලෝකෙ, මේ පෘථිවියේ ජීවත්වෙන සත්වයන් ගෙන්, ගෞතම බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය අවබෝධ කරන්න මහන්සි ගන්න

එක්කෙනාට විතරයි. අනිත් සියළු දෙනා අවබෝධ කර ගන්නෙ නෑ. සමහරු කියයි, "මේක දෙවියන් මැව්වා" කියල. බුදු රජාණන් වහන්සේ වදාළා මේකේ මැවුම්කාරයා කවුද? භවය යි. භවය තමා අපිව මේ උපතක් කරා ගෙන යන්නෙ.

## මහ බඹා පැන්ෂන් ගිහින්

ඊළඟට බුදුරජාණන් වහන්සේ නුවණින් එයාට විමසන්න කියනවා, "කුමක් ඇති කල් හි ද, මෙයා උපදින්නේ?" කියල. එයා අවබෝධ කරනවා භවයක් තිබුණොත් තමයි උපදින්නෙ, භවයක් නැත්තම් අණ්ඩජ උපතකුත් නෑ, ජලාබුජ උපතකුත් නෑ, සංසේදජ උපතකුත් නෑ, ඕපපාතික උපතකුත් නෑ, එයා ජරා, මරණ වලින් නිදහස් වෙනවා කියල.

දැන් එහෙම නම් මේ භවය එයා දන්නව. උපත කියන්නෙ මොකක්ද කියලත් දන්නවා. ඊළඟට උපත බුදු රජාණන් වහන්සේ ඉපදීම තෝරල තියෙන්නෙ කොහොම ද? "**ජාති**" කියන්නෙ ඉපදීම; "**සංජාති**" කියන්නෙ යමක් තුළ ඉපදීම; "**ඔක්කන්ති**" කියන්නෙ මව්කුසක ඉපදීම; "**අභිනිබ්බත්ති**" විශේෂයෙන් ඉපදීම; "**ඛන්ධානං පාතුභාවෝ**" රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන පංච උපාදානස්කන්ධයේ පහළ වීමත්; "**ආයතනානං පටිලාභෝ**" ඇස, කණ, නාසය, දිව, කය, මනස කියන ආයතනයන් ගේ පහළ වීමත් උපත යි. දැන් මේක ලැබෙන්නෙ, මේ උපතක් කරා යන්නෙ කුමක් හේතු කරගෙන ද ? භවයක් හේතු කර ගෙන යි.

## “මෙය තිබුනොත් මෙය ඇතිවෙයි”

හවය ගැන බුදු රජාණන් වහන්සේ බොහොම ලස්සනට අපට විස්තර කරල දිල තියෙනව. දැන් හිතන්න කියනවා, හවයක් නිසා උපදිනව. හවයක් නැත්නම් උපදින්නෙ නෑ. එහෙම නම් අපි උපදින්නෙ චුති සිත නිසා ද? හවය නිසා ද? මෙතන පැහැදිලි ව දේශනාවෙ තියෙනවා හවය ඇති කල්හි උපතක් ඇත. හවය නැති කල්හි උපතක් නැත කියල. එතකොට “හවෙ සති ජාති හෝති” හවය ඇති කල්හි උපතක් ඇත. “හවෙ අසති ජාති න හෝති” හවය නැත්නම් උපතක් නැත. එතකොට මෙයා ඉපදීම ගැනත් දන්නවා. උපත හට ගන්නෙ මෙහෙමයි කියලත් දන්නවා. උපත නිරුද්ධ වන ආකාරයත් දන්නවා. උපත නිරුද්ධ වන්නා වූ වැඩපිළිවෙලත් දන්නවා. මොකක් ද උපත නිරුද්ධ වන්නා වූ වැඩ පිළිවෙල? ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. දැක්ක ද? එයාගෙ සිතිවිලි ගානට කැරකිලා ගොනුවෙලා එන්නෙ කොතෙන්ට ද? ආර්ය අෂ්ටාංගික මාර්ගයට යි. අන්න හිතන විදිහ හරි. එතකොට ඊළඟට මෙයා නුවණින් කල්පනා කරනවා, බුදු රජාණන් වහන්සේ එයා ගැන පෙන්වා දෙනවා “අන්න කෙලෙස් නසන්න හිතන විදිහක්” කියනවා.

## උත්සාහයෙන්, වීර්යයෙන් මාර්ගයේ වෙනසක්.

ඊළඟට බුදු රජාණන් වහන්සේ දේශනා කොට වදාළා, එයා කල්පනා කරනවා මොකක් ද මේ හවය? කියල. හවය කිව්වෙ මොකක් ද? විපාක විඳින්නට කර්ම සකස් වෙනව. හව තුනක් තියෙනව. මොනව ද ඒ? කාම හවය, රූප හවය, අරූප හවය. එතකොට කාම හවයේ

විපාක විඳින්ට කර්ම සකස් වුනොත්, එයා උපදින්නේ කාම භවය තුළ. රූප භවයේ විපාක විඳින්ට කර්ම සකස් වුනොත් එයා උපදින්නෙ රූප ලෝකෙ. රූපාවචර බ්‍රහ්ම ලෝක වල උපදිනවා. අරූප භවයෙ උපදින්ට කර්ම සකස් වුනොත් අරූපාවචර ලෝක වල උපදිනවා. එහෙනම් මේ උපතක් කරා යන්න තෝරන්නෙ භවය විසින්. එතකොට භවය කිව්වෙ මොකක් ද? විපාක පිණිස කර්මය සකස් වීම. කර්ම සකස් වුනාට පස්සේ එයා එහෙම නම් උපතක් කරා යන්නේ හිතා මතා කරපු දෙයක් නිසා නොවෙයි. ඒක සිදුවෙච්ච හැටියට සිදුවෙන්න දීල ඉන්නව වගේ එකක්. ඉතින් මේක වෙනස් කරන්න පුළුවන් වුනොත්? දැන් තමාට තමාගේ උත්සාහයෙන්, වීර්යයෙන්, නුවණින් මේ ගමන් මාර්ගය සම්පූර්ණයෙන් ම වෙනස් කරන්න පුළුවන් නේද?

## නොබැඳී සිටියොත් ගමන නිමාවෙයි

ඊළඟට එයා කල්පනා කරනවා මේ භවය හටගත්තේ කුමකින් ද? මොකක් ද මේ භවයේ මුල? මොකක් ද මේ භවයේ උපත? කුමක් හට ගැනීමෙන් ද භවය ආවේ? කුමක් ඇති කල්හි ද භවය තිබෙන්නේ? කුමක් නැති කල්හි ද භවය නැත්තේ කියල විමසනවා.

දැන් බලන්න මේ විදිහට විමසන්න අනිවාර්යයෙන් ම මෙයා ආර්ය ශ්‍රාවකයෙක් වෙන්න ඕනෙ. මොකද බුද්ධ දේශනාව ශ්‍රවණය කරන්නේ නැතුව මේ විදිහට ලෝකෙ විමසන්න කෙනෙක් නෑ. එයා නුවණින් විමසන කොට අවබෝධ කරගන්නවා, මේ භවය පිණිස කර්ම හැදෙන්නෙ උපාදාන නිසා. බැඳිල යාම නිසා. උපාදානය යි මේ

භවයට හේතුව. උපාදාන නිසා ම යි මේ භවය හට ගන්නේ. උපාදානය මුල් කරගෙන යි භවය හට ගන්නේ. උපාදාන ඇති කල්හි භවය ඇත. උපාදාන නැති කල්හි භවයක් නැත. මෙයා විමසන්න පටන් ගන්නවා ඔන්න ඔය විදිහට. දැන් බුදු රජාණන් වහන්සේ අපට ඔක්කොම කියා දීල යි තියෙන්නෙ. අපිට තියෙන්නෙ ඒ අනුසාරයෙන් හිතන්න පටන් ගන්න.

## හතර ආකාරයකට බැඳී යාමෙන්....

ඉතින් බුදු රජාණන් වහන්සේ අපිට දේශනා කරන්නෙ උපාදාන කීයක් තියෙනවා කියල ද? උපාදාන හතරක් තියෙනව. මොනව ද ඒ උපාදාන හතර? කාමය කියල කියන්නෙ එක උපාදානයක්. දිට්ඨිය කියල කියන්නෙ එක උපාදානයක්. සීල ව්‍රත කියල කියන්නෙ එක උපාදානයක්. අත්තවාද – මම ය, මාගේ ය, මාගේ ආත්මය ය කියන මතය තව උපාදානයක්. ඒ කියන්නේ මේවට තමයි මේ සත්වයා තණ්හාව මුල්කර ගෙන බැඳිල යන්නෙ.බැඳෙන්න වෙන දෙයක් නෑ. කාම උපාදාන කියන්නෙ රූප, ශබ්ද, ගන්ධ, රස, පහස ට. මෙයා මේවට බැඳෙනව. හොඳට බලන්න ඔබ බැඳිල නැද්ද කියල මේවට. රූප, ශබ්ද, ගන්ධ, රස, පහස ට. අන්න ඒ බැඳී සිටීමට කියනවා කාම උපාදාන කියල. නොයෙක් මතවාද වලට, නොයෙක් දෘෂ්ටි වලට, නොයෙක් ආකල්ප වලට, බැඳි බැඳී යන එකට කියනවා, දිට්ඨි උපාදාන කියල. සිතේ ඒ වගේ ලක්ෂණ තියෙනව. නොයෙක් සීල වලට, නොයෙක් ව්‍රත වලට බැඳී බැඳී යන ඒවට කියනවා සීලබ්බත උපාදාන කියල. අපි ව්වා ඔක්කොට ම අහුවුනානේ මේ ජීවිතයේ දී. ඊළඟට තියෙනවා, අත්තවාද උපාදාන. මම ය, මාගේ

ය, මාගේ ආත්මය ය කියල මේකට මේ මම කියන වචෙන ම විනෙ නෑ. දැන් අපි සත්තු ගනිමු. පිඹුරෝ වගේ සත්තු වචනයක් කතා කරන්නෙ නෑනෙ. උපාදාන නැද්ද? තියෙනව. "මම" කියන වචනෙ විනෙ නෑ. ඒ හැඟීම තියෙනව. දැන් මාව් ගමු, කථා කරන්නෙ නෑනෙ. නමුත් උපාදාන නැද්ද? හතර ම තියෙනව. ඒ නිසා මේ මම කියන වචනේ මේ භාෂාවෙන් අයින් කළා කියල අවබෝධයක් ඇතිවෙන්නෙ නෑ. මම, මගේ, මගේ ආත්මය කියන හැඟීමට බැඳිල යනව. ඉතින් මෙන්න මේ උපාදානය බුදු රජාණන් වහන්සේ වදාළා. එයා නුවණින් විමසනවා, මේ උපාදානය හට ගත්තේ කුමක් නිසා ද? මොකෙන් ද මේ උපාදානය හැදුනේ? කුමක් මුල් කරගෙන ද මේ උපාදානය ඇති වුනේ කියල. නුවණින් විමසන කොට, විමසන කොට එයා අවබෝධ කරගන්නවා මෙන්න මෙහෙම. මේ බැඳී යාම සිද්ධ වුනේ තණ්හාව නිසා ම යි. තණ්හාව මුල් කර ගෙන ම යි. මේ ආස කරන අරමුණු වලට, මේ ආශ්වාදජනක අරමුණු වලට හිත ඇදිච්ච නිසා ම යි මේ බැඳීයාම ඇතිවුනේ කියල, අන්න එයා උපාදානය හටගන්න ආකාරය දකිනව. මේ ආශාව, මේ තණ්හාව, මේ ඇල්ම නැති වෙච්ච දවසට බැඳෙන්න දෙයක් නෑ. නිදහස්. ඒ උපාදානය නිරුද්ධ වන මාර්ගය තමයි ආර්ය අෂ්ටාංගික මාර්ගය.

## තණ්හාවක් නැත්නම් කුමකට බැඳෙන්න ද?

එහෙම නම් දැන් උපතක් නිරුද්ධ වෙන්න, භවයක් නිරුද්ධ විය යුතුයි. භවය නිරුද්ධ වෙන්න නම්, උපාදාන නිරුද්ධ විය යුතුයි. උපාදාන නිරුද්ධ වෙන්න නම්, තණ්හාව නිරුද්ධ විය යුතුය. මේ ඔක්කොම නිරුද්ධ

වෙන්න නම් ආර්ය අෂ්ටාංගික මාර්ගය ම යි වඩන්න තියෙන්නෙ. එතකොට බලන්න ආර්ය අෂ්ටාංගික මාර්ගය මනාකොට නිරවුල් කරගන්න තිබෙන්නෙත් මේ ක්‍රමයට ම, මේ විදිහට ම කල්පනා කර කර තමයි. ඉතින් බුදුරජාණන් වහන්සේ වදාළා, මෙයා අවබෝධ කර ගන්නවා, තණ්හාව නිසා උපාදාන හට ගන්නවා කියල. උපාදාන කියන්නෙ මේවාට යි. උපාදාන හටගන්නේ තණ්හාවෙන්. තණ්හාව නිරුද්ධ වුනොත් උපාදාන නිරුද්ධ වෙලා යනව.තණ්හාව ඇති තැන උපාදාන ඇත. තණ්හාව නැති තැන උපාදාන නැත. අන්න ඒ විදිහට නුවණින් කල්පනා කරන එක්කෙනා මේ උපාදාන නිරුද්ධ වීම පිණිස ප්‍රතිපත්තියේ යෙදෙනවා. අන්න එයා සියව් දුකින් නිදහස් වෙනවා.

## එති එතී යද්දි ගලා යනව වගෙයි

ඊළඟට එයා තව දුරටත් නුවණින් විමස විමසා බලනවා, මේ තණ්හාව මොකෙන් ද හට ගන්නෙ කියල. තණ්හාව කිව්වෙ ආශාව. හිත ඇදිල යන ස්වභාවය. හිත ඇලෙන ස්වභාවය. කය ඇලෙන එක නං හොයන්න පුළුවන් නෙ. හිත ඇලෙන එක හිත දිහා බලලා ම යි, නුවණින් විමස විමස බලලා ම යි තේරුම් ගන්න තියෙන්නෙ. දැන් කයක් බිත්තියකට හේත්තු වෙලා තියෙනවා හොයන්න පුව්වන්නෙ. අයින් වෙන්න කියපු ගමන් ඉවරයි වැඩේ. හිත එහෙම ද? නෑ. ආශාව කියන එක එහෙම ද? නෑ. සිත යි, කය යි දෙක ම ඇදගෙන යනව. මේ ආශාව කියන එක බුදු රජාණන් වහන්සේ දේශනා කරල තියෙනවා **"විසත්තිකා"**, මේක වැලක් වගේ එති එතී යන එකක්. බුදුරජාණන් වහන්සේ පෙන්වලා දුන්නේ **"සරිතා"** මේක නිකං ගලාගෙන යනව වගේ.

## අළු යට සැඟවුණු ගිණි අඟුරු වගෙයි

තණ්හාව කියන එක බුදු රජාණන් වහන්සේ නොයෙක් වචන වලින් පෙන්වා දෙනවා. මේ තණ්හාව තුන් ආකාරයකින් තියෙනවා; කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා කියල. භව තණ්හා, විභව තණ්හා සියල්ල අපි තුළ තියෙනව. නමුත් අපි දැන් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ වලට නේ ප්‍රතික්‍රියා දක්ව දක්ව ඉන්නෙ. ඒ නිසා දැන් ප්‍රකට ව තියෙන්නෙ මොනව ද? කාම තණ්හාව. අපි කාම තණ්හාව ප්‍රහාණය කරල අනාගාමී වුනොත්, අන්න හඳුන ගන්නව, භව තණ්හා විභව තණ්හා දෙක. දැනට ඒක හඳුනගන්ටවත් බැරි විදිහට යි අපේ හිතේ තියෙන්නෙ. ඉතින් මේ තණ්හාවෙ මුල මොකක් ද? කුමකින් ද මේ තණ්හාව හට ගන්නෙ කියල එයා නුවණින් විමසන්න පටන් ගන්නවා. නුවණින් විමසන කොට, විමසන කොට අවබෝධ කර ගන්නවා එයා තණ්හාව හට ගන්නේ විඳීම නිසා. විඳීම තමයි තණ්හාවේ හේතුව, මූලික කාරණය කියල.

## රස බලල යි සසරට වැටුනේ...

අපි කියමු අපි කාපු නැති දෙයක්, අපි කාලා නැති ජාතියක් අපිට යාළුවෙක් ගෙනත් දෙනව. පොඩ්ඩක් මේක කාලා බලපන් කියල. අපි මොකද කරන්නෙ, ඇඟිල්ල ගහල දිවේ ගා ගත්ත. ගාගෙන මොකද කරන්නෙ. තළු මරණවා. රස වැටුණා. ඊට පස්සෙ තළු මරලා අහනවා, උඹ කාගෙන් ද මේක ගත්තෙ කියල. එහෙම දෙයක් කෙරෙන් නැද්ද? කෙරෙනව. අන්න දැක්කනේ, මේ විඳීම නිසා නෙවෙයි ද එහෙම වුනේ? අපි කියමු ගෙනත් දුන්නා

මොනවහරි කියල. අපි ඒක වින්දේ නැත්නම් දන්නෙ නෑ නේද? එහෙනම් අපිට ඒක වින කමක් වෙන්නෙ නෑ. අපිට විනකමක් ඇති වුනොත් මොනවා හරි, රස කැවිලි තියෙන තැනකට යන්න. ඉස්සෙල්ලා මුදලාලි මොකද කරන්නෙ? පොඩි කෑල්ලක් දෙනවා, මේක කාලා ඉන්න කියල. රඹුටන් ගන්න ගියා ම රඹුටන් ගෙඩියක් දෙනවා, ඉස්සෙල්ලා කාල බලන්න කියනවා. කාලා බලපු ගමන් වේදනා පච්චයා තණ්හා. අන්න විඳීම හේතුකොට ගෙන තණ්හාව හටගත්ත. තළු මරලා හරි ගියෙ නැත්තම් හරියන්නෙ නෑ. වෙන තැනකට යනවා. අන්න එතනින් බලනවා. වේදනා පච්චයා තණ්හා. විඳීම හේතුකොට ගෙන තණ්හාව ඇති වෙන්නෙ. හැම දේම එහෙම යි.

## සැපට නින්ද ගියා, ඒත් ණය යි.

අපි කියමු වාඩිවෙන්න මෙට්‍රස් එකක් ගන්න ගියා කියල. ඉස්සර වෙලා අපි මොකද කරන්නෙ? වාඩිවෙලා බලනවා. වාඩිවෙලා පැද්දිලා දෙපාරක් උඩපැනල බලනව. එතකොට තමා අපිට ගානට සතුටක් ලැබෙනව නම් ලැබෙන්නෙ. අන්න හිත ඇලෙනවා එතෙන්ට. ණයක් හරි වෙලා ඒක ගන්නවා. ගන්න සල්ලි නැත්නම් කල්පනා කර කර ඉන්නවා, සීට්ටුවක් හරි දාල ගන්න ඕනෙ කියල. අන්න බලන්න එතකොට විඳීමක් නිසා නෙවෙයි ද අපි ඇලෙන්නෙ? විඳීමක් නිස යි ඇලෙන්නෙ. දැන් මේ සිහියෙන් හිටියේ නැත්නම්, සිහියෙන් බැලුවේ නැත්නම් සිහියෙන් විමසුවේ නැත්නම් අපිට මෙබඳු ක්‍රියාකාරීත්වයක් මේ ජීවිතේ ඇතුළෙ තියෙනවා කියල හොයන්න බෑ. අන්න නුවණින් විමසලා බලනවා. බලනකොට එයාට පේනවා, මේ තණ්හාව නිසානේ, මේ ඔක්කොම ඇතිවෙන්නෙ කියල. එහෙම නම් මේ තණ්හාව නැත්නම්, ඇලීමක් නෑ.

## නිවී සැනසුන ජීවිතයක සුන්දරත්වය

සාරිපුත්ත මහ රහතන් වහන්සේ තමන් වහන්සේ ගැන කියනවා, “තෙත දෙයක් වුනත් කමක් නෑ, දානෙට හම්බවුනහ ම. වේලිච්ච දෙයක් වුනත් කමක් නෑ” කියල. එතකොට රහතන් වහන්සේලා ගෙ මනස හැදිල තියෙන්නෙ කොහොම ද? බඩගින්න නිවා ගැනීමට මොනව වුනත් කමක් නෑ. දැන් බලන්න, ඒ මට්ටමට එන්නේ කොහෙම ද? අන්න යෝනිසෝ මනසිකාරයෙන් ඇති වෙච්ච අවබෝධයෙන් ම යි. එතකොට ඒ සාරිපුත්ත මහ රහතන් වහන්සේ කුටිය ගැන කියන්නෙ මේ විදිහට යි. “මම යම් කුටියකට ගිහිල්ල දණහිස් දෙක නවාගත්තට පස්සෙ මාව තෙමෙන්නෙ නැත්නම් මට ඒ ඇති” කියනවා. බලන්න ඒ තණ්හාව ප්‍රහාණය කරපු මානසිකත්වයේ සුන්දරත්වය. ඉතින් මේ නිසා තණ්හාවට මුල මොකක් ද? විඳීම යි. ඉතින් බුදු රජාණන් වහන්සේ වදාලා විඳීම නිසා තණ්හාව හටගන්නවා. විඳීමක් නැත්තම් තණ්හාවක් නෑ. තණ්හාව නැති කරන්ට තියෙන මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. අන්න එයා ඒ විදිහට නුවණින් කල්පනා කරන්න පුරුදු වුනොත්, එයාට පුළුවන් වෙනවා ධර්මය දකින්න.

## දිය බුබුලක ස්වභාවයෙන් යුතු විඳීම.

ඊළඟට විඳීම. විඳීම හය ආකාරයි. ඇසේ ස්පර්ශයෙන් විඳිනවා, කණේ ස්පර්ශයෙන් විඳිනවා, නාසයේ ස්පර්ශයෙන් විඳිනවා, දිවේ ස්පර්ශයෙන් විඳිනවා, කයේ ස්පර්ශයෙන් විඳිනවා, මනසේ ස්පර්ශයෙන් විඳිනවා. සැපත් විඳිනවා, දුකත් විඳිනවා,

සැප දුක් රහිත උපේක්ෂාවත් විදිනවා. එතකොට මේ විදීම් වල ස්වභාවය බුදු රජාණන් වහන්සේ විස්තර කරල තියෙන්නෙ කොහොම ද? ඔබට මතක ඇති නෙ දිය බුබුලක් වගේ. වළාකුලක් වගේ එක ම ආකාරයකට නෑ, වෙනස් වෙනවා. ස්පර්ශය වෙනස් වෙන කොට විදීම ඇති වෙනව කියල, එතකොට විදීම හට ගන්නේ මොකෙන් ද? ස්පර්ශයෙන් ම යි. අභැයි, රූපය යි, විඤ්ඤාණය යි එකතු වෙන්න ම විනෙ විදීමක් හට ගන්න. කණ යි, ශබ්දය යි, විඤ්ඤාණය යි එකතු වෙන්න ම විනෙ විදීමක් හට ගන්න. නාසය යි, ගඳ සුවඳ යි, විඤ්ඤාණය යි එකතු වෙන්න ම විනෙ විදීමක් හට ගන්න. දිව යි, රසය යි, විඤ්ඤාණය යි එකතු වෙන්න ම විනෙ විදීමක් හට ගන්න. කය යි, පහස යි, විඤ්ඤාණය යි එකතු වෙන්න ම විනෙ විදීමක් හට ගන්න. මනස යි, අරමුණු යි විඤ්ඤාණය යි එකතු වෙන්න ම විනෙ විදීමක් හට ගන්න. එහෙම නම් ස්පර්ශය හට ගැනීමෙන් තමයි විදීමක් හට ගන්නෙ. ස්පර්ශය නිරුද්ධ වීමෙන්, විදීම නිරුද්ධ වෙනව. විදීම නිරුද්ධ වන්නා වූ වැඩ පිළිවෙල ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. ස්පර්ශය ඇති තැන විදීම ඇත. ස්පර්ශය නැති තැන විදීම නැත. එතකොට මෙයා විදීම අවබෝධ කිරීම පිණිස, විදීමෙන් නිදහස් වීම පිණිස ධර්ම මාර්ගයේ, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරනවා.

## ආයතන හයේ නිෂ්පාදකයා - නාමරූප.

ඊළඟට ස්පර්ශයත් එයා නුවණින් විමසනවා. ස්පර්ශය හය ආකාර යි. මොනවද ඒ? ඇසේ ස්පර්ශය, කණේ ස්පර්ශය, නාසයේ ස්පර්ශය, දිවේ ස්පර්ශය, කයේ ස්පර්ශය, මනසේ ස්පර්ශය. බුදුරජාණන් වහන්සේ වදාළා

මේ ස්පර්ශය හට ගන්නෙ. මොකෙන් ද? ඇස, කණ, නාසය, දිව, කය, මනස කියන මේ ආයතන හය තිබීමෙන් තමයි ස්පර්ශයක් හට ගන්නෙ කියල. මේ ආයතන හය නැත්තන් ස්පර්ශයක් නෑ. මේ ස්පර්ශය නිරුද්ධ වෙන්ට තියෙන මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. ආයතන හය ඇති තැන ස්පර්ශය ඇත. ආයතන හය නැති තැන ස්පර්ශය නැත. අන්න එයා නුවණින් බලනකොට එයාට ආර්ය මාර්ගය දියුණු කරන්න පුළුවන් වෙනව. මේ දුක් සදහට ම නැති කරන්න පුළුවන් වෙනව. එහෙම නම් මේ ආයතන හය ගැන එයා නුවණින් කල්පනා කරලා බලනවා, ආයතන හය හට ගන්න මුල් වෙච්ච කරුණ මොකක් ද කියල. ආයතන හය හට ගන්නෙ මොකෙන් ද? කුමක් ප්‍රධාන කරගෙන ද කියල. ආයතන හය හට ගන්නෙ නාම රූප වලින්. නාම රූප වලින් තමයි ඇහැ හැදෙන්නෙ. සතර මහා ධාතු වලින් විතරක් නෙවෙයි. නාම රූපයන්ගෙන් තමයි ඇසක් කියල එකක් හැදෙන්නෙ. නාම රූපයන්ගෙන් තමයි කණත් හැදෙන්නෙ. නාම රූප වලින් තමයි නාසයත් හැදෙන්නෙ. නාම රූප වලින් තමයි දිවත් හැදෙන්නෙ. නාම රූප වලින් තමයි කයත් හැදෙන්නෙ. නාම රූප වලින් තමයි මනසත් හැදෙන්නෙ.

## නාම රූප නැති තැන ආයතන නැත.

දැන් ලී වලින් හදපු බඩුවේ තියෙන්නෙ ලී. ප්ලාස්ටික් වලින් හදපු බඩුවේ තියෙන්නෙ ප්ලාස්ටික්. යකඩ වලින් හදපු බඩුවේ තියෙන්නෙ යකඩ. නාමරූප වලින් හදපු බඩුවේ තියෙන්නෙ නාමරූප. දැන් ඇහෙන් රූපයක් දැක්කහම මනසිකාරය මුල් කරගෙන

විඤ්ඤාණයක් හට ගන්නවා. එතකොට හැදෙන්නෙ ස්පර්ශය. නාමයක් ද? නැද්ද? නාමයක්. ස්පර්ශයෙන් හට ගන්නවා විදීමක්. නාමයක් ද? නැද්ද? නාමයක්. චේතනා නාමයක් ද? නැද්ද? නාමයක්. එතකොට සංඥාවත් නාමයක්. එතකොට බලන්න නාම රූප වලින් හැදිච්ච ඇහැට පුළුවන් ඇහැ තුළ ආයෙමත් නාම රූප හදන්න. නාම රූප වලින් හැදිච්ච කණෙන් ආයෙ නාම රූප හැදෙනවා. නාම රූප වලින් හැදිච්ච නාසයේ ආයෙ නාම රූප හැදෙනවා. ඒ නිසා ඒ නාම රූප ම තමයි ආයෙ බිහි කරන්න පුළුවන්.

එතකොට නාමය කිව්වෙ වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර කියන පහ. රූප කිව්වෙ සතර මහා ධාතූන් හා සතර මහා ධාතූන් ට අයිති දේ. විඤ්ඤාණය නාම රූප නිසා හැදෙන එකක් මිසක්, නාම රූපයට ඇතුළත් එකක් නොවේ. එතකොට බුදු රජාණන් වහන්සේ වදාලා නාම රූප ඇති තැන ආයතන හය ඇත. නාම රූප නිරුද්ධ වෙන තැන, ආයතන හය නැත. එහෙම නම් ආයතන හය නැති කරන්න තියෙන මර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. මෙන්න මේ විදිහට මෙයා නිරවුල් කර ගන්නවා.

## විඤ්ඤාණය නැති තැන නාමරූප නැත.

ඊට පස්සෙ එයා බලනවා, නාම රූපයන් ගේ ක්‍රියාකාරීත්වය සිදුවන්නේ කුමක් නිසා ද? මොකක් ද මේකෙ මුල? මූලික කාරණය කියල. බලනකොට එයා අවබෝධ කර ගන්නවා, විඤ්ඤාණය නිස යි, නාම රූප හට ගන්නෙ කියල. ඇහේ විඤ්ඤාණය හට ගන්නවා,

කණේ විඤ්ඤාණය හට ගන්නවා, නාසයේ විඤ්ඤාණය හට ගන්නවා, දිවේ විඤ්ඤාණය හට ගන්නවා. කයේ විඤ්ඤාණය හට ගන්නවා. මනසේ විඤ්ඤාණය හට ගන්නවා. විඤ්ඤාණය හට ගත්ත ද, එතැන ස්පර්ශය තියෙනවා. විඤ්ඤාණය නිරුද්ධ වෙන තැන, නාම රූප නිරුද්ධ වෙන තැන. එතකොට එහෙම නම් විඤ්ඤාණය ඇති කල්හි නාම රූප ඇත. විඤ්ඤාණය නැති කල්හි නාම රූප නැත. නාම රූප නැති වන්නා වූ මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය යි.

## මේක පැටලුනොත් අමාරුයි. මේ පටිච්ච සමුප්පාදයේ සංස්කාර.

ඊට පස්සෙ එයා තවදුරටත් විමසනවා විඤ්ඤාණය කුමක් නිසා ද? සංස්කාර නිසා. සංස්කාර හේතු කොට ගෙන විඤ්ඤාණය හට ගන්නවා. සංස්කාර නිරුද්ධ වීමෙන් විඤ්ඤාණය නිරුද්ධ වෙනවා. සංස්කාර නිරුද්ධ වන්නා වූ මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. මේ දේශනාවේ සංස්කාර දෙවර්ගයක් විස්තර වෙනව. ඒ තමයි දැන් ඔන්න අවිද්‍යාව නිසා පවතින සංස්කාර කොටසක් තියෙනව. දන්නවා ද මොනවද ඒ? ආශ්වාස ප්‍රාශ්වාස නම් වූ කාය සංස්කාර; විතක්ක විචාර නම් වූ වචී සංස්කාර; සංඥා වේදනා නම් වූ චිත්ත සංස්කාර. මේ සියල්ල සාමාන්‍ය සත්වයා තුළ අවිද්‍යා සහගතවයි පවතින්නේ.

රහතන් වහන්සේ ආශ්වාස ප්‍රාශ්වාස කරනවා. අවිද්‍යා සහගතව ද? නෑ. විතක්ක විචාර රහතන් වහන්සේට තියෙනව. අවිද්‍යා සහගත ද? නෑ. සංඥා වේදනා රහතන් වහන්සේට තියෙනව. අවිද්‍යා සහගත ද?

නෑ. ඒ නිසා රහතන් වහන්සේට අවිද්‍යා සහගත විඤ්ඤාණයක් නෑ. රහතන් වහන්සේට පටිච්ච සමුප්පාදයක් නෑ. අවිද්‍යාව නිරුද්ධයි.

## "ඒ...ඒ විදිහට, ඒ...ඒ තැන

බුදු රජාණන් වහන්සේ වදාළා, තව සංස්කාර ජාතියක් තියෙනව. අවිද්‍යාවෙන් ම යි, ඒ සංස්කාර ජාතියත් රැස්කරන්නෙ. ඒ තමයි මේකෙ තියෙනවා, **"අවිජ්ජාගතෝ යං භික්ඛවේ පුරිස පුග්ගලෝ, පුඤ්ඤං චේ සංඛාරං අභිසංඛරෝති, පුඤ්ඤූපගං හෝති විඤ්ඤාණං"** මහණෙනි, මේ අවිද්‍යාව තුළ ඉන්න අවිද්‍යාවට පැමිණ සිටින සත්වයාට, ඒ කියන්නෙ අවබෝධයෙන් තොර එක්කෙනා පුණ්‍ය වූ සංස්කාරයක්, පිනක් නම් රැස් කරන්නෙ, විඤ්ඤාණය හැදෙනවා පිනට අනුව. එහෙම නම් අපි පිනක් කරලා පතන්න දෙයක් නෑ. පිනක් කරා ම ප්‍රාර්ථනාවකින් සිදු වෙන්නෙ නෑ කියල හොඳට ඔප්පු වෙන තැනක් මෙතන. පිනක් කරනවා නම්, ඒ පිනට අනුකූලව විඤ්ඤාණය හැදෙනවා. ඊළඟට **"අපුඤ්ඤං චේ සංඛාරං අභිසංඛරෝති අපුඤ්ඤූපගං හෝති විඤ්ඤාණං"** පවක් නම් කරන්නෙ පවට අනුව විඤ්ඤාණය හැදෙනවා. **"අනෙඤ්ජං චේ සංඛාරං අභිසංකරෝති අනෙඤ්ජූපගං හෝති විඤ්ඤාණං"** සමාධියක් නං රැස් කරන්නෙ සමාධියට අනුව (ආනින්ජ සංස්කාරයට අනුව) විඤ්ඤාණය හැදෙනවා. එහෙම නම් අපිට පේනවා මේ විඤ්ඤාණය කියන එක මේ පැලවිලා යන වැලක් වගේ.

## වැල යන අතට මැස්ස ගහල දුකේ වැටෙන්න එපා !

දැන් අපි කියමු ඔන්න වැලක් තියෙනවා, අපි වැලට මැස්ස ගහනවා දකුණු පැත්තේ. ගහල වැල පොඩ්ඩක්

හේත්තු කරනවා. එතකොට මොකද වෙන්නෙ? වැල දකුණු පැත්තට යනවා. වැල දකුණු පැත්තට යද්දි අපි වැලට වැඳගෙන කියනව, අනේ උතුරට යන්න කියල. යයි ද වැල? නෑ. ඇයි ඒ? මැස්ස ගහල තියෙන්නෙ යම් තැනක ද, ඒ මැස්ස ගහපු තැනට යි වැල යන්නෙ. ඊට පස්සෙ වැල යන එක වෙනස් කරන්න නං මොකද කරන්න ඕනෙ. වැල ගලවලා මැස්ස මේ පැත්තෙන් ගහන්න ඕනෙ. ගහල ඒ පැත්තට වැල පැටලෙව්ව ම, ඒ පැත්තෙන් වැල යනවා. ඊට පස්සෙ අපි කියනව, අනේ ඔය පැත්තට වැල යන්න එපා අර පැත්තට වැල යන්න. යයි ද? නෑ. ඇයි ඒ? මැස්ස ගැහුවේ යම් පැත්තක ද, ඒ පැත්තට වැල යනව. ඒ වගේ පිනක් කළා නං පුණ්‍ය විපාක කරා පිනට අනුව හැදිල යනව. විඤ්ඤාණය අනාත්මයි කියන එක හොඳට ප්‍රකට වන තැනක් මේ. පවක් කළා නං පවට අනුව විඤ්ඤාණය හැදිල යනව. සමාධියක් හොඳට වැඩුවනං, ඊට අනුව විඤ්ඤාණය හැදිල යනව. මේ හැදිල යන්නෙ අවිද්‍යා සහගතව. අවිද්‍යා සහගත පුද්ගලයා සංස්කාර රැස් කරන විදිහට යි. ඉතින් මේකෙදි බුදු රජාණන් වහන්සේ වදාළා යම් දවසක අවිද්‍යාව ප්‍රහාණය වුනොත්, අවිද්‍යාව ප්‍රහාණය වෙනවා කියන්නෙ මොකක් ද? දුක්ඛ ආර්ය සත්‍යය, සමුදය ආර්ය සත්‍යය, නිරෝධ ආර්ය සත්‍යය, මාර්ග ආර්ය සත්‍යය ගැන තිබෙන නොදැනීම නැතිවෙලා යාම. ඊට පස්සෙ දුක්ඛ ආර්ය සත්‍යය අවබෝධ කර ගන්නවා. දුක්ඛ සමුදය ප්‍රහාණය කරනවා. දුක්ඛ ආර්ය සත්‍ය කියන්නෙ ඇස, කණ, නාසය, දිව, කය, මනස ආදී මේ පැවැත්ම. දුක්ඛ සමුදය කියන්නෙ මේකට ආශා කිරීම. ඒ ආශා කිරීම නැතිවෙලා ගියා ම ඒක ඉවරයි. එයා දුකෙන් නිදහස් වෙනව, දුක්ඛ නිරෝධය සාක්ෂාත් කරනව. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාව, ඒ කියන්නෙ ආර්ය අෂ්ටාංගික

මාර්ගය සම්පූර්ණ වුනහම තමයි ඒක සිද්ධ වෙන්නෙ. එතකොට මෙයා විද්‍යාව පහල කර ගන්නවා. විද්‍යාව පහල කර ගත්තු එක්කෙනා ගැන කියනවා, එයා පුඤ්ඤාභි සංස්කාර රැස් කරන්නෙ නෑ. ඇයි? විඤ්ඤාණය හැදෙන්නෙ නෑ ඒ විදිහට. අන්න බලන්න එතකොට මේ සංස්කාර. චේතනාත්මකව අපි හිතලා කටයුතු කිරීමෙදි මේ විඤ්ඤාණය හැදි හැදී යන්නෙ අනවබෝධය නිසා මිසක්, ආර්ය සත්‍යාවබෝධ නොකර සිටින නිසා මිසක්, අවබෝධයක් තුළින් නොවේ.

## නෙළුම් කොළේ ජලය රැඳෙන්නෙ නෑ වගේ....

ඉතින් මේකෙ තියෙනවා, බුදු රජාණන් වහන්සේ හරි ලස්සනට විස්තර කරල, චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගත්තට පස්සෙ විද්‍යාව පහළ කර ගත්තට පස්සෙ පුණ්‍ය වූ සංස්කාර රැස් කරන්නෙත් නෑ. අපුණ්‍ය වූ සංස්කාර රැස් කරන්නෙත් නෑ. අනෙන්ජ සංස්කාර රැස් කරන්නෙත් නෑ. සංස්කාර රැස් කරන්නෙ නැත්නම්, දැන් මැස්ස ගැහුවට වැඩක් තියෙනව ද? වැඩක් නෑ. එතකොට සංස්කාර නම් මැස්ස, වැල නම් විඤ්ඤාණය. වැලත් නෑ. මැස්සත් නෑ. අන්න ඒ වගේ සංස්කාර රැස්වෙන්නෙ නැත්නම් ඒ සංස්කාරයට අනුරූප වූ විඤ්ඤාණයක් හැදෙන්නෙ නෑ. හැදෙන්නෙ නැති වුනාට පස්සෙ විඤ්ඤාණයේ ක්‍රියාකාරිත්වය නැතිව තියෙනකොට මොකද වෙන්නෙ? සංස්කාර රැස් කරන්නෙ නැතිව යනකොට **(අනභිසංඛරොන්තෝ අනභිසං චේතයන්තෝ)** සංස්කාර රැස් නොකර යනකොට චේතනාත්මක ක්‍රියාව ඒ කියන්නෙ අවිද්‍යා සහගතව සිදු නොවන කොට **(න ච කිංචි ලෝකේ උපාදියති)** එයා ලෝකෙ කිසිවකට බැඳෙන්නෙ නෑ. **(අනුපාදියං න පරිතස්සති)** කිසිවකට

බැඳෙන්නෙ නැති වෙන කොට තැති ගන්න දේකුත් නෑ. **(අපරිතස්සං පච්චත්තං යේව පරිනිබ්බායති)** කිසිවකට තැති නොගෙන ඉන්න කොට තමා තුළ ම නිවිල යනව. බුදු රජාණන් වහන්සේ වදාළා එයා සැප වේදනාවක් විඳිනව නං ඒ සැප විඳීම අනිත්‍යය යි කියල දන්නව. ඇයි? **“වේදනා පච්චයා තණ්හා”** වෙන්නෙ නෑ දැන්. ඇයි අවිද්‍යා සහගත නෑ. දැන් යම් දුක් වේදනාවක් විඳිනවා නම්, ඒ දුක් වේදනාව අනිත්‍යය යි කියල දන්නවා. යම් දුක් සැප රහිත විඳීමක් විඳිනවානං ඒ දුක් සැප රහිත විඳීම අනිත්‍යය යි කියල දන්නවා. ඒ නිසා අනිත්‍යය වූ දෙයක් එයා පිළිගන්නෙ නෑ කියලත් එයා දන්නවා. මේ නිසා එයා සැපත් විඳිනවා, හැබැයි සැපත් එක්ක එකතු වෙන්නෙ නෑ. දුක විඳිනවා, දුකත් එක්කත් එකතු වෙන්නෙ නෑ. දුක් සැප රහිත බවත් විඳිනවා. දුක් සැප රහිත බවත් එක්ක එකතු වෙන්නෙ නෑ. එහෙනම් රහතන් වහන්සේ කියන්නෙ සැප විඳිනවා, සැප එක්ක එකතු වෙන්නෙ නැතිව. ඇයි? ඒක අවබෝධ කරල. දුක විඳිනවා. දුකත් එක්ක එකතු වෙන්නෙ නෑ. ඊළඟට අදුක්ඛම සුඛ වේදනා විඳිනව, ඒකත් එක්ක එකතු වෙන්නෙ නෑ.

## පෝරණුවෙන් බාපු හට්ටි මුට්ටි වගෙයි

ඊළඟට දන්නවා මේ ඔක්කොම විඳීම් විඳින්නෙ, මේ ශරීරෙ තියෙනකම් විතරයි. මේ ඔක්කොම විඳීම් විඳින්නෙ මේ ජීවිතේ තියෙනකම් විතරයි. මේ කය බිඳිලා ගියාට පස්සෙ මේ සෑම විඳීමක් ම නොපිළිගන්න නිසා, ඒ කෙරෙහි නොබැඳෙන නිසා, මේ සියල්ල ම මෙතන ම අවසන් වෙලා යනවා කියල අවබෝධ කර ගන්නවා. බුදු රජාණන් වහන්සේ වදාළා මේක මේ වගේ දෙයක් කියල. ඔන්න කුඹල්කරුවෙක්. ඒ කියන්නෙ වලං හදන

මනුස්සයෙක් වලඳක් හදනවා, වලඳක් හදලා ඊට පස්සෙ ඒක පුච්චනවා, පෝරණුවේ දාලා. පුච්චලා වලඳ බානවා. බිමට බෑවට පස්සෙ වලඳෙ රස්නෙ නැද්ද? තියෙනව. නමුත් රස්නය හැම තිස්සෙම තියෙනව ද? රත්වෙවී? නෑ. යම් රස්නයක් තිබ්බ ද? බිමට බෑවට පස්සෙ එතන එහෙම්ම ම ඒ රස්නය නිවිල ගිහිල්ල ඉතිරි වෙනව වලං කට්ට. ඒ වලං කට්ට තමයි පාවිච්චි කරන්නෙ. අන්න ඒ වගේ කියනවා බුදු රජාණන් වහන්සේ වදාලා යම් වේදනාවක් විඳිනව ද, සැප වේදනාවක්, ඒක පිළිගන්නෙ නෑ. යම් වේදනාවක් විඳිනව ද, දුක් වේදනාවක්, ඒක පිළිගන්නෙත් නෑ. යම් වේදනාවක් විඳිනවා ද, මධ්‍යස්ථ සැප දුක් රහිත විඳීමක්. ඒක පිළිගන්නෙත් නෑ. එයා එතකොට කය තියෙනකම් විතරයි, මේ විඳීම් ඔක්කොම තියෙන්නෙ. ජීවිතේ තියෙනකම් විතරයි, මේ විඳීම් ඔක්කොම තියෙන්නෙ. කය බිඳිල මරණයට පත්වුනාට පස්සෙ, ජීවිතේ අවසන් වුනාට පස්සෙ යම් තාක් විඳීම් තියෙනව ද, මේ විඳීම් සියල්ල ම නිවිල යනව.

## රහතන් වහන්සේගේ විඤ්ඤාණය

ඊළඟට බුදු රජාණන් වහන්සේ වදාළා පිංවත් මහණෙනි, රහතන් වහන්සේ පුණ්‍යාභි සංස්කාර හෝ අපුණ්‍යාභි සංස්කාර හෝ අනෙන්ජාභි සංස්කාර හෝ රැස් කරනවා ද? පින් හරි, පව් හරි, අනෙන්ජ සංස්කාර හරි රහතන් වහන්සේට රැස් වෙනවද කියල අහනවා. එහෙනං ඊට අනුකූලව විඤ්ඤාණයක් හැදෙන්නෙ නෑ. එහෙනම් සියවිම සංස්කාරයන් නිරුද්ධ නම් එබඳු ආකාර සංස්කාර නිරුද්ධ නම්, එබඳු සංස්කාරයන්ගෙන් හැදෙන පිනට අනුකූල වූ විඤ්ඤාණයක් වත් පවට අනුකූල විඤ්ඤාණයක් වත් සමාධියට අනුකූල විඤ්ඤාණයක් වත්

ඇහේ හෝ, කණේ හෝ, නාසයේ හෝ, දිවේ හෝ කයේ හෝ මනසේ හෝ හටගන්නෙ නෑ. පුඤ්ඤාභි සංඛාරයකට වුවමනා කරන සංඛාරයක් හැදෙන්නෙ නෑ. එතකොට සර්වප්‍රකාරයෙන් ම විඤ්ඤාණය නැත්නම්, ඒ විඤ්ඤාණයට අනුකූල නාමරූප හැදෙනව ද? නෑ. සර්වප්‍රකාරයෙන් ම ඒ නාම රූප නැත්නම්, ඒ නාම රූපයට අනුකූල වූ ඇහැක් පවතී ද? නෑ. එහෙනම් රහතන් වහන්සේගේ ඇස, කණ, නාසය, දිව, කය, මනස පවතින්නෙ සංස්කාර වල ක්‍රියාකාරීත්වයෙන් තොරව. පුඤ්ඤාභි සංඛාර, අපුඤ්ඤාභි සංඛාර, අනෙන්ජාභි සංඛාර කියන සංස්කාර වලින් තොරව. ඒ නිසා නාම රූප ප්‍රත්‍යයෙන් හට ගන්න ඇහැ, කණ, නාසය, දිව, කය, මනස නෑ. මේ නිසා එබදු ආයතන හයක් සර්වප්‍රකාරයෙන් ම නැත්තම්, එතන ස්පර්ශයක් හට ගන්නවා ද? නෑ. එබදු ස්පර්ශයක් සර්වප්‍රකාරයෙන් ම නැත්නම්, එතන විඳීමක් හට ගන්නවා ද? නෑ. එබඳු විඳීමක් සර්වප්‍රකාරයෙන් ම නැත්නම්, එතන ඒවට ආශාවක් හටගන්නව ද? නෑ. ආශාවක් හට ගැනීම සර්වප්‍රකාරයෙන් ම නැත්නම්, උපාදානයක් තියෙනව ද? නෑ. උපාදානයක් හට ගැනීම සර්වප්‍රකාරයෙන් ම නැත්නම් එතන භවයක් තියෙනව ද? නෑ. සියව් ආකාරයේ ම භවය නිරුද්ධ නම්, ඉපදීමක් තියෙනව ද? නෑ. ඉපදීමක් නැතනම් ජරා, මරණ, සෝක, වැලපීම්, දුක්, දොම්නස් මොකවත් නෑ.

## මේ විදිය ම යි අදහා ගන්න....

බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා "මහණෙනි, ඔන්න ඔය විදිහට (ඒව මේතං භික්ඛවේ) යි සිද්ධ වෙන්නෙ. (සද්දහති) මේක අදහා ගන්න, (ඒව මේතං

භික්ඛවේ) මේ විදිහට තමයි මේක සිද්ධ වෙන්නෙ, (අධිමුච්ඡත) විශ්වාසයේ බැසගන්න, (නිබ්කංකො එත්ත හෝත) මේ කරුණ ගැන සැක රහිත වෙන්න. (නිබ්බි විචිකිච්ඡා) විචිකිච්ඡා රහිත වෙන්නෙ. (ඒස වන්තෝ දුක්ඛස්ස) ඔන්න ඔහොමයි, දුක අවසන් වෙන්නෙ.”

## මේ මොහොත මගහැරුණොත් අපි අනතුරේ.

දැන් එතකොට බලන්න බුදු රජාණන් වහන්සේ ගේ මේ දේශනා තුළ තියෙන පැහැදිලිකම. බුද්ධ ශාසනයක් මුණ ගැහුණට පස්සෙ, මේ සංසාරයේ සංචාරය කරන්න නොවෙයි, එයාට තියෙන්නෙ. මොකද එයා බුදු රජාණන් වහන්සේගේ ශාසනයකින් තමයි, දැනුවත් වෙන්නෙ මෙච්චර දීර්ඝ ගමනක් මෙයා මේ ඇවිල්ල ඉන්නවා කියල. මෙච්චර දීර්ඝ ගමනක මෙයා පැටලි පැටලි ඉන්නවා කියල. අපි කී වාරයක් නං අපායේ උපදින්නට ඇද්ද? බොහෝ වාරයක් අපි නිරයේ, ප්‍රේත ලෝකයේ, තිරිසන් ලෝකයේ වැටි වැටී ආවේ මක් නිසා ද? ඒක මේ විදිහේ සිදුවීමක්. අවිද්‍යාව ප්‍රහාණය නොකොට අපිට ඇති වෙච්ච් මේ සිද්ධිය මේ විදිහට සිදුවෙන බව අපි දන්නෙ නැති නිසා. එහෙනම් අපිට ඒක අවබෝධ කර ගන්න තියෙන දුර්ලභ අවස්ථාවක අපි මේ ඉන්නෙ. එතකොට එයා නුවණින් කල්පනා කරන්නට ඕනෙ.

## සෙල්ලම් ගෙවල් කඩල දාන්න.

දැන් ඔන්න අහගෙන හිටියා. “ආ.. ෂෝක් බණ” ඇහුවා ගියා. ඊට පස්සෙ මොකක් ද ඇහුවෙ. දන්නෙ නෑ. එහෙම නේද වැඩිපුර. ඒක නෙවෙයි වෙන්න ඕනෙ. ධර්මය

අල්ලන්න බෑ එතකොට. සමහර අවස්ථාවල බුදුරජාණන් වහන්සේ ගේ දේශනා වල තියෙනවා බුදු රජාණන් වහන්සේ ධර්මය දේශනා කරගෙන යන්නෙ මහා කරුණාවකින්. ඒ ධර්මය දේශනා කරගෙන යන්නෙ ධර්මය අවබෝධ කර ගන්න කියල. අපිට අවබෝධ කරගන්න තියෙන ලොකුම හානිය තමයි බොහෝ දෙනෙකුට ශ්‍රද්ධාව නෑ. බුදු රජාණන් වහන්සේ ගේ අවබෝධය විශ්වාස කරන්නෙ නෑ. දැන් උන් වහන්සේගේ අවබෝධය විශ්වාස කරනවා නම් මේවා ඔක්කොම මේ විදිහම යි කියල එයා පිළිගන්නවානේ. එයාට ගැටළු ඇතිවෙන්නෙ නෑ. එයා දකිනවා තමන් ගේ ජීවිතේ තුළින් තමන් දිහා. බලනකොට තමන්ට තේරෙනවා, තමනුත් මෙහෙම නේ යන්නෙ කියල. අන්න එයා සිහිය පිහිටුවාගෙන නුවණින් විමස විමස බලනවා. බුදු රජාණන් වහන්සේ එක තැනක දේශනා කරනවා, උපමාවක්. උන්වහන්සේ දේශනා කරනවා, මේ සෙල්ලම් ගෙවල් කඩල දානවා වගේ, මේ ආශාව නැති කරන්න කියල.

## අරගෙන යන්න එපා, විසිකරල දාන්න.

උන්වහන්සේ දේශනා කරනවා, මේ චූටි ළමයි ඉස්සර කාලෙ වැලිබත් උයනවා, සෙල්ලම් කඩවල් දානවා, නෑදෑ ගෙවල් යනවා. දැන් මේ වයසේ, දරුවන් රැඳිල යන්නේ කොච්චර කාලෙකට ද? ඒ අයට ආශාව තියෙනකන් විතරයි. ඊට පස්සෙ ඒ ගොල්ලන්ට එක පාරට මේ වැලිබත් උයන එකේ ආශාව නැතිව යනවා. නැතුව ගියාම මොකද කරන්නෙ, මේ ගොල්ලො? අතින්, පයින් ගහල, කඩල වීසි කරල දානවා, මෙන්න මේ වගේ. බුදු

රජාණන් වහන්සේ වදාළා, **"විකීලනකං කරෝන්ත"** සෙල්ලම් කරන්න බැරි දෙයක් බවට පත් කරන්න. ඒ කිව්වෙ දැන් පොඩි ළමයි වැලි ටික වෙන ම අරන් තියෙන්නෙ නෑනෙ. පොල්කටු ටික වෙන ම අරන් තියන්නෙ නෑනෙ. ඒ ගොල්ලන් ගෙ සෙල්ලම් බඩු ටික වෙන ම අරන් තියෙන්නෙ නෑනෙ. ළමයි මොකද කරන්නෙ? ඉතුරු කරන්නෙ නෑ. වීසි කරනවා. කඩල බිඳල දාල තමයි දුවන්නෙ එතැනින්. කෑ ගහගෙන දුවනවා. අන්න ඒ වගේ මේක ආයේ ඉතුරු කරන්න එපා කියනවා.

## සුභාෂිත වචනය විශ්මිතයි.

බලන්න එතකොට බුදු රජාණන් වහන්සේ ඒ වගේ දේශනාවල් කරල තියෙද්දි, අපි බුදු රජාණන් වහන්සේ ගේ ශ්‍රාවකත්වයට පැමිණුනා. අපි බුදු රජාණන් වහන්සේ ව සරණ ගියා. සරණ ගිහින් දැන් අපිට ජීවිතේ ගැන තේරෙනවා. බුදු රජාණන් වහන්සේ දේශනා කරපු හැටි බලනකොට පේනවා, ඔබ ම හිතන්න දැන් ඔබ පින් කලා නම් පිනට අනුකූලව හැදෙනවා විඤ්ඤාණය. ඔබට වෙනස් කරන්න බෑ. ඔබ පවක් කලා නම්, පවට අනුකූලව විඤ්ඤාණය හැදෙනවා. ඒක වෙනස් කරන්නත් බෑ. ආනෙන්ජ කර්මයක් කළා නම් ඊට අනුරූපව විඤ්ඤාණය හැදෙනවා. ඒක වෙනස් කරන්නත් බෑ. නමුත් මේ ක්‍රියාකාරීත්වය වෙනස් කරන්න බැරි අවිද්‍යා සහගතව හිටියොත් විතරයි. විද්‍යාව පහල කර ගත්තොත්, චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගත්තොත්, විඤ්ඤාණය හැදෙන එක නැතිව යනවා. ඇයි සමහර සංස්කාර රැස් වුනොත් නේ හැදෙන්නෙ. පුඤ්ඤාභිසංඛාර රැස් වෙන්නෙත් නැත්තම්, අපුඤ්ඤාභි සංඛාර රැස් වෙන්නෙත් නැත්තම්,

අනෙන්ජාභි සංඛාර රැස්වෙන්නෙත් නැත්නම්, කොයි ම ක්‍රමයකටවත් විඤ්ඤාණයක් හැදෙන්නෙ නෑ. එතකොට බලන්න කොයි තරම් විශ්මිත ධර්මයක් ද බුදු රජාණන් වහන්සේ මේ දේශනා කරල තියෙන්නේ.

## මොන්ටිසෝරි ළමයි වගේ ඉන්න එපා.

දැන් අපේ මේ ජීවිත කතාව නේ. අපේ ජීවිතෙන් බැහැර වෙච්ච එකක් මෙතන තියෙනව ද? මෙතන නෑ. අපේ ජීවිත කථාව ම යි මේ අපි කතා කරන්නෙ. එතකොට මේ ජීවිතේ බුදු රජාණන් වහන්සේ දේශනා කරපු ධර්මය අවබෝධ කර ගන්න බැහැ. ඒක අමාරු යි. ඒක දුෂ්කර යි කියල කල්පනා කිරිම මේ වගේ දෙයක්. ළමයෙක් ඉන්නවා. දැන් මේ ළමයා ඉගෙන ගන්න යනවා. ඉස්සෙල්ලා ම යන්නෙ එයා හෝඩියේ පංතියට. ඊට පස්සෙ එයා බලනවා 10 පන්තියේ ළමයෙක් දිහා. බලලා කියනවා, "අම්මෙ, මට නම් බැහැ ඉස්කෝලෙ යන්න." ඇයි ඒ? " අර 10 පන්තියේ ළමයි ලොකු පොත් අරගෙන ලියනවා අකුරු. මට බෑ" කියල. නමුත් එයා ඒ අධ්‍යාපනයේ දිගට ම ගියොත් එයා එතෙන්ට එන් නැද්ද? එයා එතනට එනවා. අපිට වෙලා තියෙන්නෙ, දිගට ම නොයන ළමයා වගේ. එයා කියනවා, අපි ඉන්නම් දිගට ම මොන්ටිසෝරියේ ම. අපිට යන්න බෑ. ඒ වගේ තමයි ව්ක ගැඹුරුයි කියල හිතුවොත් හිතන්න නම් පුරුදු වෙන්නෙ නෑ.

## කවුද දන්නෙ කොහෙ යයි ද කියල?

අපි නුවණින් කල්පනා කළේ නැත්නම්, හවස ගෙදර යනවා වගේ අපි අපායේ උපදිනව. ගමනක් ගිහිල්ල

ගෙදර ගියා වගේ අපායට යනව. එහෙම තමයි මෙච්චර කල් වුනේ. මැරිල ගිහින් කිසි ප්‍රශ්නයක් නැතුව නිකම් ම ගිහිල්ල "ඔන්න මැරුණා" ඇහැරෙන කොට නිරයේ. ඒක තමයි ඕපපාතික උපත කියන්නෙ. ඊට පස්සෙ යම රජ්ජුරුවෝ ගාවට ගෙනියනව. යම රජ්ජුරුවෝ කියනවා, "උඹ මෙහෙම කළා, උඹ මෙහෙම කළා, මම කරපුවා නෙවෙයි, මේ උඹ කරපුවා" දැන් එහෙම කියන්න කියන්න මෙයාට මොකද වෙන්නෙ? මෙයාට මතක් වෙනවා ඇත්ත නේන්නං මං මෙහෙම කළා නෙ. මේක කළා නෙ. මේක නෙ. ඊට පස්සෙ යම රජ්ජුරුවෝ කියනවා, කරන්න දෙයක් නෑ මේක වෙන කෙනෙක් කළා නෙවෙයි, මේක ඥාතියෙක් කළා නෙවෙයි, උඹේ මිත්‍රයා කළා නෙවෙයි, නුඹේ මව නෙවෙයි මේක කළේ, නුඹේ පියා නෙමෙයි මේක කළේ. නුඹ විසින් ම යි මේක කළේ. දැන් ඉතින් විඳවපන්" කියල යම රජ්ජුරුවො නිෂ්ශබ්ද වෙනවා. යම පල්ලෝ අරගෙන ගිහින් එහෙ වද දෙනව. මෙහෙ ජයට පාංශු කූලෙ ගන්නවා. අපි මෙහේ. එයා ඕපපාතික උපතක් කරා ගිහිල්ල. වෙන්න බැරි ද? මේක වෙනවා. එහෙම නැත්නම් ඔන්න මැරුණා. ඇහැරෙන කොට බඩගින්නෙ. බඩගිනියි කියල හොයන කොට කෑම තියෙනවා, යන්න බෑ. ගන්න බෑ. පෙරේතයෙක්. ඊට පස්සෙ ඔන්න බලනවා කොහෙද කෑමක් තියෙන්නෙ කියල. ඔන්න යනකොට හොටු චුට්ටක් තියෙනවා. ඔන්න ඒක දිහා බලාගෙන, ඒක චුට්ටක් ඉඹින්න පටන් ගන්නවා. ඒක තමයි කෑම. අපි එහෙම සංසාරෙ ගෙව ගෙව ඉඳල යි මේ මිනිස් ලෝකේ ආවෙ. නැත්නම් ඔන්න මාස තුනයි, මෙහෙ අපි මාස තුනේ පිංකම් කරනවනේ. ඔන්න බච් පැටියෙක් වෙලා ඉපදිලා. එක්කො පූස් පැටියෙක් වෙලා ඉපදිලා, ඒ ගෙදර ම. අපි මේ අවුරුද්දෙ පිංකමට ලෑස්තියි. නමුත් ඒ ගෙදර ම එයා

ඉන්නවා පූස් පැටියෙක් වෙලා ඉපදිලා. අන්න එහෙම යි මේ සංසාර ගමන තියෙන්නෙ.

## පියඋරුමයේ හිටියොත් සියළු දුක් නිමා වෙනවා.

ඉතින් මෙබඳු ගමනක් යන්න ඔබ කැමති ද? මේ ගමන හැදෙන්නෙ බාහිර තැනක නෙවෙයි. කොහෙද හැදෙන්නෙ? තමා තුළ යි හැදෙන්නෙ. ඒ නිසා මෙතනදි හොඳට සිහිය පිහිටුවා ගෙන නුවණ පිහිටුවා ගෙන සතිපට්ඨානෙ ම යි සිහිය පිහිටුවා ගන්න තියෙන්නෙ. සිහින ලෝකෙක ඉන්න එපා, අනේ මට අනාගතේ කර ගන්න පුළුවන් වෙයි කියල. විවේකයක් එනකම් බලාගෙන ඉන්න එපා. ඔය විවේකය නම් එන්නෙ නෑ. තමන්ට විනෙ හැටියට එන්නෙ නෑ. විවේකයක් එනකම් බලාගෙන ඉඳල විවේකයට ගියාට පස්සෙ ඒක කරන්නෙ ත් නෑ. එහෙම තමයි මේ හිතේ ස්වභාවය. හොඳම වැඩේ තමයි, ඉඩ ලැබෙන ලැබෙන හැම වෙලාවෙ ම සිහියෙන් ඉන්න පුරුදු කරන්න. අකුසල ධර්මයන් හිතේ පෝෂණය වෙන්න දෙන්න එපා. කිසි දේකට බැඳෙන්න දෙන්න එපා. අනිත්‍ය වශයෙන් නුවණින් දකින්න. එතකොට ටික ටික සිහිය දියුණු කර කර, සිහිය දියුණු කර කර යන්න පුළුවන්. අන්න එහෙම කර ගත්තොත්, අපිට සතර අපායෙන් අත් මිදිලා මේ ජීවිතයේ දී ම උතුම් චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගන්න හැකියාව ලැබෙනව. ඉතින් ඔබ සිතේ අධිෂ්ටානයක් ඇතිකර ගන්න, මමත් සිහිය දියුණු කරගෙන සතර සතිපට්ඨානයේ ම යෙදෙමින් මේ ගෞතම බුද්ධ ශාසනය තුළ දී ම උතුම් නිවන සාක්ෂාත් කරගන්නවා කියල.

**සාදු! සාදු!! සාදු!!!**

# පටිපන්න සූත්‍රය
## (ප්‍රතිපදාවට පිවිසීම ගැන වදාළ දෙසුම)

*සංයුත්ත නිකාය 5-1*
*(ඉන්ද්‍රිය සංයුත්තය - මුදුතර වර්ගය)*

# පටිපන්න සූත්‍රය

*නමස්කාර වේවා බුදුරුවනට සැමදා බුදු හිමි සරණ යමි*
*නමස්කාර වේවා දම්රුවනට සැමදා සදහම් සරණ යමි*
*නමස්කාර වේවා සඟරුවනට සැමදා මහ සඟ සරණ යමි*
*නමස්කාර වේවා තුණුරුවනට සැමදා තිසරණ සරණ යමි*

## ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

සම්ප්‍රදායික වැඩපිළිවෙල තුළිනුත්, මූලධර්මවාදීන්ගේ කූට උපක්‍රම - නීච ව්‍යාපාර තුළිනුත්, ගෞතම බුද්ධ ශාසනය අතුරුදහන් කරවමින් සිටින යුගයකයි අපි මේ ධර්මය කියාගෙන යන්නෙ. අපට කොච්චරවත් මනුෂ්‍ය ජීවිත සංසාරෙදි ලැබෙන්න ඇති. නමුත් ඒ කිසි ජීවිතයක දී අපිට චතුරාර්ය සත්‍යය අවබෝධ කරන පණිවිඩය අපේ හිත ඇතුලට ගියේ නෑ. ඒ නිසා අපට සතර අපායේ වැටි වැටී මේ දීර්ඝ සංසාරයේ ගමන් කරන්න සිදු වුනා. ආයෙමත් අපට මිනිස් ජීවිතයක් ලැබුණා. මේ මනුෂ්‍ය ජීවිතයේදී ත්, ගෞතම බුද්ධ ශාසනය තුළ මෙන්න මේ විදිහටයි චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරන්නේ කියලා අපට මෑතක තමයි අහන්නට ලැබුණේ. එහෙම නම් අපිට පැහැදිලිව පේනවා බුදු රජාණන් වහන්සේ වදාළ බුද්ධ දේශනා අපට නිරතුරුව ම අහන්න ලැබෙන්නෙ නෑ. බුද්ධ දේශනා ශ්‍රවණය

කරන්නට නො ලැබෙන නිසා එක එක්කෙනාගේ පෞද්ගලික මතිමතාන්තර එතෙන්ට එනවා. ඒ පෞද්ගලික මතිමතාන්තර නිසා, ශාසනය අඳුන ගන්නට බැරිව යනවා. අන්න ඒ ශාසනය අඳුන ගන්නට බැරිවෙච්ච පිරිස අන්‍යාගමිකයන් විසින් ආක්‍රමණය කරනවා.

## සැඟවුන විට නොම බබලන දහමකි මෙය

පින්වතුනි, බුදු රජාණන් වහන්සේ වදාළා මෙන්න මෙහෙම පාඨයක්. **(තථාගතප්පවේදිතෝ භික්ඛවේ, ධම්ම විනයෝ විවටෝ විරෝචති. නෝ පටිච්ඡන්නෝ)** " මහණෙනි, තථාගතයන් වහන්සේ වදාළ ධර්ම විනය විවෘත වුනහම බබලනවා. සැඟවුන විට බබලන්නේ නැහැ." එහෙනම් මෙච්චර කලක් ශාසනික පරිහානියට හේතුව මොකක් ද? ධර්ම විනය සැඟ වී තිබීම නිසයි මේ පරිහානිය සිද්ධ වුනේ. මේ ධර්ම විනය විවෘත වුනා නම්, මේ පරිහානිය සිදුවෙන්නේ නැහැ. දැන් අපි ගත්තොත් වර්තමාන යුගයේ අන්‍යාගමික මූලධර්මවාදීන් බවට පත්වෙලා සිටින අයගෙන් ප්‍රධානත්වය අරගෙන කටයුතු කරන බොහෝ දෙනා ම පාහේ උපතින් බෞද්ධ අය. ඒ අය යම් යම් ආක්‍රමණ වලට හසුවෙලා, ඊට පස්සේ ඒ අයට බුද්ධ ශාසනය ගැන අප්‍රසාදය ඇති කරවලා, තමන්ගේ පැත්තට ගත්තා. දැන් ඒ අය තමයි බුද්ධ ශාසනය විනාශ කිරීමේ වැඩපිළිවෙලේ පුරෝගාමීව කටයුතු කරන්නෙ.

## දහම නො දැන ගැනීමේ විපතක මහත...

මේක හරියට ඌරගෙ මාළු ඌරගේ පිටේ තියල ම කපනව වගේ වැඩක්. එතකොට දැන් අපිට කතාව යන්නේ කොහොම ද? මේ මිනිස්සු ආගම් වෙනස්

කරන්නෙ අවබෝධයක් නැතිකම නිසා නෙවෙයි. එහෙනම් නැතිබැරිකම නිසා. නැතිබැරිකම නෙවෙයි මේකට හේතුව, (යම්කිසි නැතිබැරිකමක් තමයි ඒකත්) තිසරණය නැතිකම නිසා ඇති වුන එකක්.

## මේ ගෞතම බුද්ධ රාජ්‍යය යි !

දැන් අපි දන්නවා මේ යුගයේ අපට තියෙන්නේ ගෞතම බුද්ධ ශාසනය පමණයි. වෙන ශාසනයක් අපට නැහැ. ඉතින් මේ උතුම් ගෞතම බුද්ධ ශාසනයට, මේ ගෞතම බුද්ධ රාජ්‍යයට අපටත් ඇතුළු වෙන්න පුළුවනි. ඇතුළු වුනාට පස්සෙ අපේ අභ්‍යන්තර ජීවිතය තුළ අංග පහක් පිහිටනවා. ඒ පහට කියනවා ඉන්ද්‍රිය ධර්ම කියල. දැන් මේ ඇස, කණ, නාසය, දිව, කය ටත් කියනවා ඉන්ද්‍රිය කියලා. ඒ කියන්නේ මේ ජීවිතයත් එක්ක ප්‍රතිබද්ධ වෙලා තියෙන දේවල් නිසා. දැන් ඇස වගේ ඉන්ද්‍රියක් නම් ලෙඩවෙනවා, මැරෙනවා. ඒත් මේ කියන ඉන්ද්‍රියන් අමරණීය ජීවිතයක් කරා අපිව ගෙනියනකම් ම අපිත් එක්ක පෝෂණය වෙවී තියෙන ඉන්ද්‍රියන්. මේ ඉන්ද්‍රියයන් පහ තමයි ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා.

මේ ඉන්ද්‍රිය පහ කෙනෙකුගේ ජීවිතයක් තුළ සම්පූර්ණයෙන් ම වර්ධනය වුනොත්, අන්න ඒ කෙනාට කියනවා රහතන් වහන්සේ කියල. එහෙම නම් මේ ජීවිතය තුළ වාසනාව තියෙන කෙනෙකුට පුළුවනි, මේ ඉන්ද්‍රිය පහ ම සම්පූර්ණත්වයට පත්කර ගන්නට. ඒකට අවස්ථාව තියෙන්නෙ ගොඩාක් ම පැවිදි පක්ෂයට තමයි. ඊළඟට මේ ඉන්ද්‍රිය ඊට ටිකක් අඩු වුනොත්, එයා අරහත් මාර්ගයට පිළිපන් කෙනා. අරහත් මාර්ගයේ ගමන් කරන කෙනා. ඒ ඉන්ද්‍රිය පහ ඊට ටිකක් අඩු වුනොත් අනාගාමී කෙනෙක්.

ඒ ඉන්ද්‍රිය පහ ඊටත් චුට්ටක් අඩු වුනොත් අනාගාමී මාර්ගයේ ගමන් කරන කෙනා. ඒ ඉන්ද්‍රිය පහ ඊටත් අඩු වුනොත් සකදාගාමී කෙනෙක්. ඒ ඉන්ද්‍රිය පහ ඊටත් අඩු වුනොත් සකදාගාමී මාර්ගයේ ගමන් කරන කෙනෙක්. ඒ ඉන්ද්‍රිය පහ ඊටත් අඩු වුනොත් සෝවාන් කෙනෙක්. ඒ ඉන්ද්‍රිය පහ ඊටත් අඩු වුනොත් සෝවාන් මාර්ගයේ ගමන් කරන කෙනෙක්. එතනින් ඉන්ද්‍රිය ඉවරයි. සෝවාන් මාර්ගයේ ගමන් කරන කෙනෙකුගෙන් පහලට මේ ඉන්ද්‍රිය නෑ.

## ඉන්ද්‍රිය පිහිටල නැත්නම් ඉතින් පෘතග්ජන තමයි

බුදු රජාණන් වහන්සේ වදාළා යමෙකුට මොන ම ආකාරයකින් වත් මේ ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා කියන ඉන්ද්‍රිය පහ නැත්නම්, එයා ශාසනයට අයිති නැහැ. එයා ශාසනයෙන් බැහැර වෙච්ච පෘතග්ජන පක්ෂයේ කෙනෙක්. එහෙමනම් ශාසනයට ඇතුළු වෙන්න සෝවාන් මාර්ගයට පිවිසෙන්න ඕනෙ. ඔබ ශාසනයට අයිති ද? නැද්ද? ඔබ ඉස්සෙල්ලා ම කරන්න තියෙනනේ සෝවාන් මාර්ගයට පිවිසෙන්න ඕනෙ. සෝවාන් මාර්ගයට පිවිසෙන ප්‍රථම පියවර මොකක් ද? ශ්‍රද්ධානුසාරී. ශ්‍රද්ධානුසාරීවත් නැත්නම් එයා සෝවාන් මාර්ගයට වත් අයිති නැති කෙනෙක්. බාහිර පෘතග්ජන පක්ෂයේ කෙනෙක්. අන්න ඒ බාහිර පෘතග්ජන පක්ෂයේ අය තමයි, අන්‍යාගමිකයන්ට ගොදුරු වෙන්නේ.

## නපුරු සිත් වෙනස් කළ ඒ සොඳුරු සිත...

අන්න එතකොට දන් මේ චතුරාර්ය සත්‍යය අවබෝධ කරන පිරිස මේ ගෞතම බුද්ධ ශාසනය තුළ බිහි වුනහම කිසිම ගැටලුවක් නැතිව බුදු සසුන බබලන්න

පටන් ගන්නවා. මං ඒකට පොඩි උදාහරණයක් කියන්නම්. ඔබ අහලා තියෙනවනෙ පුණ්ණ හාමුදුරුවෝ. පුණ්ණ හාමුදුරුවෝ සුනාපරන්ත දේශයට යන්න කල්පනා කළා. බුදුරජාණන් වහන්සේට ගිහින් වන්දනා කරල යන්න සූදානම් වෙනකොට බුදු රජාණන් වහන්සේ ඇහුවා

"පින්වත් පුණ්ණ, ඔබ දැන් මේ වස් කාලයේ වැඩ සිටින්න කල්පනා කරන්නෙ කොහෙද?"

"මං කල්පනා කරනවා සුනාපරන්ත දේශයට යන්න."

"අපොයි! ඒ මිනිස්සු හරි වසයිනේ. ඔය මිනිස්සු ඔබට බනීවි."

"භාග්‍යවත් බුදුරජාණන් වහන්ස, බැන්නට කමක් නෑ. ගහන එකක් නෑනේ."

"එහෙම කියන්න බෑ. ඔය මිනිස්සු ඔබට ගහන්නත් පුළුවනි."

"අනේ! භාග්‍යවතුන් වහන්ස, ඒ මිනිස්සු මට ගැහුවට කමක් නැහැ. මගේ අතපය කපන එකක් නැහැනෙ."

"එහෙම කියන්න බෑ. ඔය මිනිස්සු ඔබේ අතපයත් කපාවි."

"අනේ භාග්‍යවත් බුදුරජාණන් වහන්ස, අතපය කැපුවට නම් කමක් නැහැ. මරණ එකක් නැහැනෙ."

"නෑ. නෑ. ඔය මිනිස්සු ඔබව මරල දමාවි."

"අනේ! භාග්‍යවතුන් වහන්ස, එතකොට මං හිත

හදාගන්නව, මට නොමිලයේ ම ආයුධ හම්බවෙනවා කියල."

"පින්වත් පුණ්ණ. ඔබ යන්න සුදුසුයි."

ඔන්න ඒ නපුරු මිනිසුන්ගේ දේශයට මේ පිවිතුරු සන්තානයක් දියුණු කරගන්න කැමති ඒ වෙනකොට නිවන් අවබෝධ කරල නැති මාර්ගය වඩන කෙනෙක් මේ පුණ්ණ. මේ ස්වාමීන් වහන්සේගේ අහිංසක ජීවිතයට මේ මිනිස්සු වසඟ වුනා. ඊට පස්සේ ඒ නපුරු මිනිස්සු ටික ඇහුවා, "කොහොමද ඔබවහන්සේ ඔය තත්වයට පත්වුනේ?" කියල. එතකොට කිව්වා "මෙන්න මේ විදිහට ජීවිතය දිහා බලන්න. මෙන්න මේ වගේ දුර ගමනක් අපි ආවේ. මේකෙ මෙන්න මේ විදිහට නුවණ දියුණු කරන්න" කියල. පින්වතුනි, වස් කාලෙ ඇතුලත අර නපුරු මිනිසුන්ගෙන් 500 ක් මහණ වුනා. ඒ 500 ම රහත් වුනා. එතකොට අර නපුරුකම, දුෂ්ටකම ඔක්කොම රැඳිලා තිබුනේ සද්ධර්ම ශ්‍රවණය නො ලැබුණු නිසා. සද්ධර්ම ශ්‍රවණය ලැබිච්ච දවසේ ඒ අය සම්පූර්ණයෙන් ම වෙනස් වෙලා ගියා.

## කියන්නම් සෙනෙහසින් - මිය නො යන් හිස් අතින්...

එහෙනම් අපිට පේනවා මේ ගෞතම බුද්ධ ශාසනය පරිහාණියට පත් වුනේ පිරිසිදු සද්ධර්මය නො ලැබුණු නිසයි. පිරිසිදු ශ්‍රී සද්ධර්මය අපේ මුතුන් මිත්තන්ට ලැබුණ නම්, ඒ අය හිස් අතින් මැරෙන්නෙ නැහැ. අපේ අම්මලා තාත්තලා හිස් අතින් මැරෙන්නෙ නැහැ. අඩු ගණනේ ශ්‍රද්ධානුසාරීවත් වෙලා තමයි මරණයට පත්වෙන්නෙ. ඉතින් මේ නිසා අපි මෙන්න මේ ඉන්ද්‍රිය ධර්ම පහ හොඳට තේරුම් ගන්න ඕනෙ. මේ ඉන්ද්‍රිය

ධර්ම පහ අපට තියෙනව නම් අපි ඒ ගැන ගොඩක් සතුටු වෙන්න ඕනෙ. මේ ඉන්ද්‍රිය ධර්ම අප තුළ වර්ධනය වෙලා නැතිනම් අපි ඉක්මනින් ම වර්ධනය කර ගන්න මහන්සි ගන්න ඕනෙ.

## සැදැහැසිත් හදාගෙන නිවනට ම යමු අපිත්...

මේ ඉන්ද්‍රිය ධර්ම පහෙන් පළවෙනි ඉන්ද්‍රිය ධර්මය තමයි ශ්‍රද්ධා ඉන්ද්‍රිය. ඒ කියන්නේ ශ්‍රද්ධාව ඇති කර ගන්න ඕන ඔබ මේ ලෝකයේ කාටවත් ම වෙනස් කරන්න බැරි විදිහට. ඒක මෙහෙමයි කරන්නෙ. සංයුත්ත නිකායේ දේශනාවක් තියෙනවා දුතිය විභංග කියල. ඒ දේශනාවෙ තියෙනවා

**(කථමංච භික්ඛවේ සද්ධිංද්‍රියෝ)** "පින්වත් මහණෙනි, ශ්‍රද්ධා ඉන්ද්‍රිය කියන්නේ මොකක් ද?" **(ඉධ භික්ඛවේ අරිය සාවකෝ සද්ධො හෝති)** "පින්වත් මහණෙනි, ආර්ය ශ්‍රාවකයා ශ්‍රද්ධාවන්තයෙක් වෙයි." **(සද්ධහති තථාගතස්ස බෝධිං)** "තථාගත බුදු රජාණන් වහන්සේගේ අවබෝධය අදහා ගනී" අන්න එතනින් තමයි අපි මේ ශාසනයට ඇතුළු වෙන්නෙ. මේක අදහා ගන්නේ මෙහෙමයි. **(ඉතිපි සෝ භගවා අරහං)** "මෙසේ භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ අරහන් වන සේක." ඒ කිව්වෙ රාග, ද්වේෂ, මෝහ නැති, නික්ලේෂී, පාරිශුද්ධ සන්තානයකින් සමන්විත වන සේක. ඔන්න පළවෙනි එක අපි ශ්‍රද්ධාවට පැමිණෙන. ඊළඟට තියෙනවා **(සම්මා සම්බුද්ධෝ)** ගුරුවරයෙගේ උපදේශයකින් තොරව බාහිර කෙනෙකුගේ අනුග්‍රහයකින් තොරව චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධයෙන් ම සම්පූර්ණ කර ගත්තා. **(විජ්ජා චරණ සම්පන්නෝ)** බුදු රජාණන් වහන්සේ විශේෂ

ඤාණයනගෙන් සමන්විතයි. බුදුරජාණන් වහන්සේට තිබුණ විශේෂ ඤාණ තමයි, අතීත ජීවිත දැකීමේ ඤාණය. ඒ වගේ ම උන්වහන්සේට තිබුණා සත්වයන් චුත වෙන උපදින ආකාරය දකින නුවණ. ඊළඟට උන්වහන්සේට තිබුණා තව කෙනෙකුගේ සන්තානය දකින නුවණ.

## සංසාරේ අපි යනෙන තුරා....

මේ සත්වයන්ගේ අතීත ජීවිත කොච්චර දක්කද කියන්නෙ බුදු රජාණන් වහන්සේ දේශනා කළා "පින්වත් මහණෙනි, **(අවිජ්ජා නීවරණානං භික්ඛවේ, සත්තානං තණ්හා සඤ්ඤෝජනානං)** අවිද්‍යාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු සත්වයන්ගේ මේ සංසාර ගමන **(අනමතග්ගෝ)** අවසානයක් දකින්ට බැරි දෙයක්. **(පුබ්බා කෝටි න පඤ්ඤායති)** පටන් ගත්තු ආරම්භක කෙළවර පෙන්නෙ නෑ." බුදු රජාණන් වහන්සේ බුදු නුවණින් එබඳු අදහසක් දේශනා කළාට පස්සේ වර්තමානයේ කවුරුහරි බෞද්ධ කෙනෙක් (අන්‍යාගමිකයෝ නම් අතරමං වෙන එක අහන්න දෙයක් නෙවෙයිනෙ) සත්වයාගේ ආරම්භය ගැන මතයක් ඉදිරිපත් කළොත් ඒක අර බුදු රජාණන් වහන්සේගේ අදහසට පටහැනි නැද්ද? පටහැනියි.

## සාගර ජලය පරදා....

බුදු රජාණන් වහන්සේ බුදු නුවණින් බලලා දේශනා කරනවා ආරම්භක කෙළවරක් දක්ක නො හැකියි. මේ අවිද්‍යා සහගත සත්වයා මේ සංසාරෙ සැරිසරා ආ ගමන කොච්චර දීර්ඝ ද කියනවා නම්, බුදු රජාණන් වහන්සේ වදාළා, "පින්වත් මහණෙනි, මේ සත්වයා (තනි පුද්ගලයෙක්) මේ සසර සැරිසරා යන ගමනේ දී බොන ලද මව්කිරි ප්‍රමාණය සතර මහා සාගරයේ ජලයට වැඩියි"

කියලා. එහෙනම් අපි එක එක්කෙනා මේ සිව් මහා සමුද්‍රයේ ජලය පරදා මව්කිරි බීලා තියෙනවා. එතකොට මේ සංසාර ගමන මේසා දීර්ඝ වුනේ මක් නිසාද? චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ නො කිරීම නිසා. එතකොට අන්න බුදු රජාණන් වහන්සේගේ බුදු නුවණ. බුදුරජාණන් වහන්සේගේ අවබෝධය අදහන කෙනාට ඒකේ කිසි ගැටලුවක් නැහැ. එයා ඒක එකපාරට ම පිළිගන්නවා. මොකද අපි දන්නවා උන්වහන්සේ නිකෙලෙස් කියලා. නිකෙලෙස් කෙනෙකුට මනුෂ්‍යයෙක් අමාරුවේ දාන්න, රවටන්න ඕනෙ කමක් නැහැ. වෙන කෙනෙක් කිව්ව නම් අපිට කියතහැකි එයා නම් ඉතින් ඔය බය කරන්න තමයි මේක කිව්වෙ කියල. බුදු රජාණන් වහන්සේ නිකෙලෙස් බව උන්වහන්සේ ගේ ජීවිතය පුරා ම දකින්නට ලැබෙනවා. එතකොට බලන්න මේ අපට ලැබිච්ච ලාභය වෙන ආගමකට නැහැ.

## නැණවත් ය මගේ බුදු පියාණන් වහන්සේ....

බුදුරජාණන් වහන්සේ ගේ ඤාණ, ඒ අවබෝධයට කියනවා 'විජ්ජා' කියල. ඊට අනුකූලව උන්වහන්සේගේ ජීවිතේ ගොඩනැගිලා තිබුණා. ඒකට කියනවා 'චරණ' කියල. එතකොට මේ විජ්ජා චරණ දෙකෙන් ම බුදු රජාණන් වහන්සේ සමන්විතයි. ශ්‍රාවකයාට ඒ ගැන පැහැදීමක් තියෙනවා.

ආර්ය අෂ්ටාංගික මාර්ගය තරම් සුන්දර මාර්ගයක් මේ ලෝකයේ නැහැ. ඒ සුන්දර මාවතේ කෙලවර දක්වා ම වැඩිය නිසා බුදුරජාණන් වහන්සේ 'සුගත' වන සේක. සුන්දර මාවතේ කෙළවර මොකක් ද? නිවන. ඒ නිසා උන්වහන්සේට කියනවා සුගත කියල.

උන්වහන්සේට මේ ලෝකෙ රහස් නැහැ. අපට නම් මෙයින් බැහැර තව ලෝක ඇද්ද? තව ග්‍රහලෝක ඇද්ද? තව ජීවීන් ඇද්ද? හරිම පටලැවිලි ගොඩක් නෙ. බුදු රජාණන් වහන්සේ බඹලොව ගැන දන්නවා. දෙව් ලොව ගැන දන්නවා. බුද්ධ දේශනාවල දෙව්ලොව වල ආයුෂ ගැන පවා තියෙනවා.

## කාලය ගෙවෙන වේගය....

ඊළඟට උන්වහන්සේට මේ ජීවිතය ගැන පුදුම අවබෝධයක් තිබුණා. දැන් අපි ගනිමු කාලය ගැන. කාලය කියන්නෙ දවසක් පැය විසිහතරෙන් බෙදලා ඒ පැය විසි හතර ගෙවන කාල පරිච්ඡේදය අපි හඳුන්වනවා කාලය කියල. බුදු රජාණන් වහන්සේ කාලය ගැන අපිට කියා දීලා තියෙන හැටි බලන්න කොයි තරම් ලස්සන ද කියලා. ඔන්න බුදු රජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගෙන් අහනවා "පින්වත් මහණෙනි, දක්ෂ දුනුවායන් හතර දෙනෙක් එක තැනක හිටගෙන ඉන්නවා හතර පැත්තට හැරිලා. ඊතල හතරක් විදිනවා. තනි පුද්ගලයෙක් මේ ඊතල හතර බිමට වැටෙන්නට ඉස්සර වෙලා දුවගෙන ගිහිල්ලා අරගෙන එනවා. ඉතින් පින්වත් මහණෙනි, මෙයා කොහොම වේගයෙන් දුවන්න පුළුවන් කෙනෙක් ද?" එතකොට ස්වාමීන් වහන්සේලා පිළිතුරු දෙනවා " භාග්‍යවතුන් වහන්ස, එක දුනුවායෙක් ඉඳගෙන ඊතලයකින් විදිද්දී ඒ ඊතලේ බිමට වැටෙන්නට කලින් යමෙකුට දුවගෙන ගිහින් අරගෙන එන්න පුළුවන් නම් බිමට වැටෙන්න ඉස්සර වෙලා අල්ලගන්න, එයා අතිශයින් ම ජව සම්පන්න කෙනෙක්. වේගවත් කෙනෙක්. එහෙම එකේ මේ හතර දෙනෙක් දුනු ඊතල හතරක් විදිද්දී ඒ ඊතල අරන් ඒමේ වේගය ගැන කවර කතා ද?"

ඉතින් බුදු රජාණන් වහන්සේ වදාළා, "පින්වත් මහණෙනි, ඔයිට වඩා වේගයෙන් ගමන් කරනවා මේ චන්ද්‍රයා සහ සූර්යයා. ඒ චන්ද්‍රයා සහ සූර්යයා ටත් වඩා වේගයෙන් ගමන් කරනවා ඊට අධිගෘහිත දෙවිවරු. ඊටත් වඩා වේගයෙන් ගමන් කරනවා ඔබේ ආයුෂ." අන්න කාලය පිළිබඳ විග්‍රහය.

බුදුරජාණන් වහන්සේගේ අවබෝධය විශ්මය ජනක යි. මේ ලෝක ගැන උන්වහන්සේගේ අවබෝධය ආශ්චර්යයි. ලෝක විදූ. දැන් ඔබ ඒ කලින් කියූ ඒවා අහලා තියෙනව ද? එතකොට අපිට තේරෙනවා එහෙනම් මේ ධර්මය විවෘත නො වීමෙන් තමයි අපි ආවරණය වෙලා ඉඳලා තියෙන්නෙ. ධර්මය විවෘත වුනා නම් ධර්මය බබලනවා. අපේ ජීවිතත් බබලනවා.

## මෙන්න සැබෑ දමනය කිරීම....

බුදුරජාණන් වහන්සේ අනුත්තරෝ පුරිස දම්ම සාරථී වන සේක. දෙව් මිනිසුන් දමනය කිරීමේ අනුත්තර වූ නායකයාණන් වහන්සේ. උන්වහන්සේ කිසිම දවසක ආයුධයක් පාවිච්චි කළේ නැහැ. උන්වහන්සේ කිසිම දවසක නපුරු වචනයක් පාවිච්චි කරලා නැහැ. උන්වහන්සේ කිසිම දවසක නපුරු සිතක් පාවිච්චි කරලා නැහැ.

බුදුරජාණන් වහන්සේ පමණක් නොවෙයි, උන්වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේලාවත් එහෙම කරලා නැහැ. බුදුරජාණන් වහන්සේ දෙවියන්වත් දමනය කළා. බ්‍රහ්මයින්වත් දමනය කළා. මිනිසුන්වත් දමනය කළා. සතුන්වත් දමනය කළා. ඒ සඳහා උන්වහන්සේ පූර්ණ සාමකාමී මනසින් තමයි ඒක කළේ.

## මම නැවතුනෙමි. ඔබ ද නවතින්න.

ඔබ දන්නවා අංගුලිමාල අල්ලන්න සේනාවක් යැව්වා. පුළුවන් වුනා ද අල්ලන්න. බැරිවුනා. අන්තිමට බුදු රජාණන් වහන්සේගේ බුදු නෙනට හසුවුණා අවසාන මොහොතේදී. ඒ කොහොම ද හසු වුනේ. අන්න මව් ගියා පුතාව සොයාගෙන. බුදුරජාණන් වහන්සේ දුටුවා දැන් මෙයා මව මරන්නට පුළුවනි. මොකද ඒ වෙනකොට අංගුලිමාල පෘථග්ජන කෙනෙක්. පෘථග්ජනයෙකුගේ අතින් තමයි ඒක සිද්ධ වෙන්නේ. බුදු රජාණන් වහන්සේ ඊට කලින් එතනට සාමාන්‍ය භික්ෂුවක් හැටියට වැඩම කළා.

බුදු රජාණන් වහන්සේ දැකලා අංගුලිමාල කල්පනා කළා. මට හරි ලේසියි, තව එක ඇඟිල්ලයි ඕනෙ කියලා පන්නගෙන ගියා. පන්නගෙන යනවා යනවා දැන් බුදුරජාණන් වහන්සෙයි අංගුලිමාලයි අතර දුර බඹ දෙකක් වගේ තත්වෙට ආවා. පන්නගෙන දුවනව. ළං වෙන්න බෑ. අන්තිමට අංගුලිමාලට කියන්න සිද්ධ වුනා, "ශ්‍රමණය, නැවතියං" කියල. බුදුරජාණන් වහන්සේ මොකක්ද වදාළේ? "මං නැවතිලා ඉන්නෙ. ඔබ නවතින්න" කියල. එතකොට අංගුලිමාල මොකද කිව්වේ? "ඔබ බොරු කියනවා. ඔබ නැවතිලා නෑනේ." බුදුරජාණන් වහන්සේ වදාළා "මම නැවැත්තුවා, සියලු හිංසා. ඔබ නැවැත්තුවේ නැහැනේ." බලන්න ඒ වචනෙත් එක්ක අංගුලිමාල සම්පූර්ණයෙන් ම වෙනස් වෙලා ගියා. එයා අර ඇඟිලිමාල කඩලා වීසි කළා. කඩුව වීසි කළා. බුදු රජාණන් වහන්සේ ගාව වැඳ වැටුනා. "අනේ මට තේරෙනවා. ඒක මාව බේරගන්න කළේ කියලා." උන්වහන්සේ අනුත්තරෝ පුරිස දම්ම සාරථී. ඉතින් උන්වහන්සේට පහදින්න ඕනෙ පැති මම මේ කියන්නෙ.

## සියලු ලොවට එක ලෙස සලකන්නේ....

ඊළඟට දෙව් මිනිසුන්ට ශාස්තෘන් වහන්සේ. දෙවියන්ගේත් මිනිසුන්ගේත් නිවන් මග පෙන්වා දෙන උතුමාණන්. දෙව් ලොව දෙවියන් හිටියා කියල, බඹ ලොව බඹුන් හිටියා කියල ගෞතම බුදුරජාණන් වහන්සේ පහල වෙලා නිවන් මග කියනකම් ම පිළිසරණක් තිබුණෙ නෑ. දැන් පිළිසරණ තියෙනවා දෙව් ලොව දෙවියන්ට, බඹ ලොව බඹුන්ට, ගෞතම බුදුරජාණන් වහන්සේ නිවන් මග පවසන නිසා. අන්න පහදින්න දේවල්.

ඊළඟට බුද්ධ කියන්නෙ අවබෝධ කොට වදාළ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ වෙන ආකාරයට දේශනා කරනවා. උන්වහන්සේ ගේ දේශනා කෞෂල්‍යය නම් විස්මිත යි. ආශ්චර්ය යි. ඒක බලන්න බුද්ධ දේශනා ම කියවන්න ඕනෙ. එතකොට ඒ බුද්ධ ගුණය ඔබට හොඳට දකින්න පුළුවනි. උන්වහන්සේ කොයි තරම් විස්මිත විදිහට මේ චතුරාර්ය සත්‍යය ගැන මේ ශ්‍රාවකයින් ව දැනුවත් කරලා තියෙනව ද කියල.

## දැන් ඔබේ අවස්ථාව.....

බුදුරජාණන් වහන්සේ මේ සියලු ගුණ දැරීමට තරම් භාග්‍යවන්තයි. ඔන්න ඕක තමයි ශ්‍රද්ධාව. බලන්න දැන් ඔබ තුළ ඔය ශ්‍රද්ධාව තියෙනව ද කියල. ඔබ කේන්දරේට නම් පහදින්නෙ, නැකතට නම් පහදින්නෙ, දෙවිවරුන්ට නම් පහදින්නෙ ඔබේ ශ්‍රද්ධාව තඹ දොයිතුවක් වටින්නෙ නැහැ. ඔබේ ශ්‍රද්ධාව තිබිය යුත්තේ බුදු රජාණන් වහන්සේ ගැනයි. අන්න එතුළින් තමයි ඔබ සෝවාන් මාර්ගයට බැස ගත්තු කෙනෙක් බවට පත්වෙන්නෙ.

## බුදු සසුනෙන් තොරව නොමැත.

ශ්‍රද්ධා ඉන්ද්‍රිය විතරක් මදි. ඊළඟට තියෙන්න ඕනෙ මොකක්ද? වීරිය ඉන්ද්‍රිය. මේ වීරිය ඉන්ද්‍රිය උගන්වන්නෙ බුද්ධ ශාසනයේ විතර ම යි. ඒ තමයි අපට තියෙනවා, ඇති වෙච්ච අකුසල්, ඒ කියන්නෙ උපන් අකුසල්. බුදු රජාණන් වහන්සේගේ ධර්මයේ උගන්වනවා උපන් අකුසල් නැති කරන්න වීරිය ගන්න කියල. ඊළඟට හට ගත්තෙ නැති අකුසල් තියෙනවා. ඒවට කියන්නෙ නූපන් අකුසල්. ඒවා හටගන්න දෙන්න එපා. අප තුළ තියෙනවා හටගත්තු කුසල්. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා උපන් කුසල් වැඩිදියුණු කරගන්න කියල. ඊළඟට අප තුළ තියෙනවා ඉපදිච්ච නැති කුසල්. සීල, සමාධි, ප්‍රඥා ආදී ගුණ ධර්ම. වර්ධනය වෙලා නැති අන්න ඒ ගුණ ධර්ම උපද්දවා ගන්න වීරිය ඉන්ද්‍රිය අවශ්‍ය වෙනවා.

## මළ කඳන් නොවන්න - වීරියවන්ත වන්න.

යම්කිසි කෙනෙක් තමන්ගේ අභ්‍යන්තර ජීවිතයේ අකුසල් ප්‍රහාණය කරන්න ඕනෙ කියලා කල්පනා කරන්නෙ නැත්නම්, කුසල් දියුණු කරන්න ඕනෙ කියලා කල්පනා කරන්නෙ නැත්නම්, වීරිය උපදවා ගන්න උත්සාහ කරන්නෙ නැත්නම්, එය යි මළකඳ යි දෙක ම එක යි.

දැන් බලන්න බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයේ කොයි තරම් හොඳ දේවල් තියෙනවා ද? අපිට කාලයක් තිස්සේ අහන්න ලැබෙන්නේ මේ වීරිය ගැන කියන ඒවා නො වෙයිනේ. මේ දුක ගැන ම කිය කිය ඉන්නවා. කර්මයට ම ඔක්කොම බාර දීලා තියෙන්නෙ. කර්මය කියලා බුදුරජාණන් වහන්සේ නො වදාළ දෙයක් ගැන තමයි පොදු ජනතාව දන්නෙ.

## මේ සටනින් පැරදුම නොව මරණය වේවා!

බුදුරජාණන් වහන්සේ මේ වීරිය ගැන කියලා තියෙන්නෙ මෙන්න මේ විදිහට යි. "මේ මගේ සම්, මස්, නහර ඇට ඉතිරිවේවා. ලේ මස් වියැලේවා. යම් පුරුෂ වීරියකින්, පුරුෂ පරාක්‍රමයකින්, පුරුෂ ධෛර්යකින් යමක් අවබෝධ කළ යුතු නම් මං එය අවබෝධ නො කොට මේ වීරිය අතහරින්නේ නෑ." එබඳු වීරිය තිබිච්ච අය තමයි ඉක්මනින් ඉක්මනින් මාර්ගඵල අවබෝධ කළේ.

බුදුරජාණන් වහන්සේ දවසක් භික්ෂූන්ට කියනවා "මහණෙනි, ලිච්ඡවීන් මෙච්චර සශ්‍රීක ඔය මිනිස්සු නිදාගන්නේ ලී කොට්ට උඩ ඔලුව තියාගෙන. ඒත් අනාගතේ මේ ගොල්ලන්ගේ දරු පරම්පරාවට සල්ලි බාගෙ වැඩියි. සැප වැඩියි. මේගොල්ලෝ ලී කොට්ට අයින් කරලා පුළුං කොට්ට තියා ගන්නවා ඔළුවට. ඊට පස්සේ අජාසත් මේ ගොල්ලන්ව නිකම් ම යටත් කරනවා. පින්වත් මහණෙනි, දැන් භික්ෂූන් රහත් වෙනවා වැඩියි. මොකද හේතුව දැන් මේ භික්ෂූන් නිදාගන්නෙත් ලී කොට්ට ඔලුවට තියාගෙන. ඒත් අනාගතේ භික්ෂූන් ලී කොට්ට අයින් කරලා පුළුං කොට්ට ඔලුවට ගන්නවා. එදා ඉඳලා මේ ගොල්ලෝ අලස භාවයට පත්වෙනවා. ඊට පස්සේ වීරිය නැති වීමෙන් ඒ මාර්ගයේ දියුණු වෙන්නේ නැතිව යනවා."

එහෙනම් අපට පැහැදිලිව ම පේනවා මේ ධෛර්ය සම්පන්න වීරියවන්ත ජීවිතය තුළ තමයි බුදු රජාණන් වහන්සේගේ ධර්මය තියෙන්නේ. මේ වීරිය බුද්ධ ශාසනයේ විතරයි අනිත් ඒවයේ නැහැ.

## සිහිය නම් සතර සතිපට්ඨානය ම යි

ඊළඟට අපිට තියෙනවා සති ඉන්ද්‍රිය. ජීවිතයකට අතිශයින් ම වැදගත් දෙයක්. සතිය කියන්නෙ සිහිය. සිහිය කියන්නෙ සතර සතිපට්ඨානය. දැන් සතර සතිපට්ඨානය කිව්වට කෙනෙකුට එක පාරට ම තේරෙන්නෙ නැති වෙන්න පුළුවන්. මොකද කාලයක් තිස්සෙ ධර්මයක් අහලා නෑනෙ. ධර්මයක් අහල නැති නිසා දහම් කරුණු ගැන එක පාරට ම තේරෙන්නෙ නැහැ. සිහියෙන් ඉන්නවා කියන්නෙ තමන්ගේ ජීවිතේ රැවටීමකට පත්වෙන්නෙ නැති විදිහට අවබෝධයෙන් කල්පනාවෙන් ඉන්න එක. එතකොට අවබෝධයෙන් කල්පනාවෙන් ඉන්න එක ඒ විදිහට තේරුම් ගන්න ඕනෙ.

## මාල පබලු වැල් ගෙළ වට පළඳා....

දැන් සාමාන්‍යයෙන් අපි ගත්තොත් අපිට කය ගැන සිහියක් තියෙනවා. ඒ කියන්නෙ අපි කොණ්ඩෙ පීරනවා, ඊළඟට නියපොතු පාට කරනවා, සුවඳ වර්ග ගානවා, ආභරණ පළඳිනවා, තොල් පාට කරනවා. මේ වගේ අපි මගුල් ගෙවල් වලට යන්න, විශේෂ ගමන් බිමන් වලට යන්න මේ ඇඟ සරසන්නේ නැද්ද? සරසනවා. දැන් මේවා විශාකාව පවා කරලා තියෙනවා. විශාකාව ඉණේ පළන්දගෙන හිටියා 'මහාලතාපසාදනය' කියන එක. ඒක බෙල්ලෙ පළඳින එකක් නොවෙයි. ඉණේ පළඳින එකක්. එතකොට ඒක ඉණට පළඳින කොට මේකෙ හැඩබැලිල්ලක් තියෙනවා. නමුත් ඒ කෙනා දන්නවා මේ කය අනිත්‍යය යි කියල. අන්න දැක්ක ද? කය ගැන සිහිය පිහිටුවන්නට දක්ෂ වුනා නම් එයාට එතන සතිය තියෙනවා.

## වේදනා පිරි ලොවක්....

ඊළඟට අපිට ලැබෙනවා සැප-දුක්-උපේක්ෂා විඳීම්. සැප ලැබෙනවා දුක් ලැබෙනවා උපේක්ෂාව ලැබෙනවා. මේවා ලැබුනට පස්සේ මේ විඳීම් ගැන හොඳ සිහියෙන් බලන්න පුළුවන් විය යුතුයි. ඒකේ ඇත්ත ස්වභාවය, ඒ කියන්නේ රැවටීමකට ලක් නො වන විදිහට ඒ තමයි, මේ විඳීම් අනිත්‍යය යි නේද කියල සිහිය පිහිටුවගන්නවා.

## සිතෙන සිතෙන හැම මොහොතෙම...

ඊළඟට ඔබේ සිත ගැන ඔබට සිතෙන දේවල්. ඔබේ සිතිවිලි. ඒ ගැන ඔබට කල්පනාවෙන් ඉන්න පුළුවන් කම. ඊළඟට අනිත්‍ය දේ අනිත්‍ය වශයෙන් ඔබට නුවන හසුරුවන්ට පුළුවන් කම. මේ ඔක්කොම මොනවද? සතිය.

ඔබට මතකද "උන්නාභ" කියල බ්‍රාහ්මණයෙක් බුදු රජාණන් වහන්සේගෙන් ඇහුවා "ස්වාමීනී, ඔවුනොවුන්ට වෙනස් වූ ගෝචර විෂය ඇති ආයතන පහක් තියෙනවා. ඒ තමයි ඇස, කණ, නාසය, දිව, කය. (එකිනෙකට වෙනස් වූ ගෝචර විෂය ඇති කියන්නේ අහෙන් බලන්නේ රූප විතරයි. ඇහෙන් ශබ්ද අහන්න බෑ. කණෙන් අහන්නේ ශබ්ද විතරයි. කණෙන් රූප බලන්න බෑ. නාසයෙන් ගඳ සුවඳ විතරයි දැනගන්න පුළුවන්. රස බලන්න බෑ. දිවෙන් රස දැනගන්නවා විතරයි. ගඳ සුවඳ දැනගන්න බෑ. කයින් පහස දැනගන්නවා විතරයි. රස දැනගන්න බෑ. එතකොට එකිනෙකින් වෙනස් වූ ගෝචර විෂය ඇති ආයතන පහක් තියෙනවා.) මේ ආයතන පහට පිළිසරණ මොකක් ද?" කියල ඇහුවා. බුදුරජාණන් වහන්සේ වදාළා මේ ආයතන පහට පිළිසරණ මනස යි කියල.

මං ඒක තව තේරෙන විදිහට කියන්නම්. දැන් ඔබ ඇහෙන් රූපයක් දකිනවා. දැකලා ඒක ඉවර වුනා. ඒක නැතිවෙලා ගියා. දැන් ඔබ ඒක සිහිකරනවා. සිහි කරනකොට දැන් ආයෙ සිතට අරමුණක් වශයෙන් ඒක ගන්න බැරි ද? එහෙම නම් ඒ ඇහෙන් රූපේ දැක්කට එතන මනසේ සම්බන්ධයක් තිබිලා තියෙනවනෙ. නැත්නම් කොහොම ද ඒක අරමුණක් වශයෙන් ගන්නෙ. අන්න එතන මනස තමයි පිළිසරණ වෙලා තියෙන්නෙ ආයතනයට.

## සිතට පිළිසරණ සිහිය යි.

බුදුරජාණන් වහන්සේගෙන් උන්නාභ බ්‍රාහ්මණයා ආයෙමත් අහනවා "ස්වාමීනී, මනසට පිළිසරණ මොකක් ද?" බුදුරජාණන් වහන්සේ වදාළා "මනසට පිළිසරණ සතිය යි" අන්න හිතන්න පුළුවන් මනුෂ්‍යයෙකුගේ ප්‍රශ්න. මෙයා අබෞද්ධ කෙනෙක්. නමුත් එයාගේ කල්පනා ශක්තිය කොයිතරම් දියුණු ද කියන්නෙ එදා ඒ දේශනාව ඉවර වෙලා එයා එතනින් ගියේ අනාගාමී කෙනෙක් හැටියට.

එතකොට අපට පැහැදිලිව ම පේනවා කල්පනා ශක්තිය අපි වහ වහා ම මනාකොට දියුණු කරගන්න ඕනෙ. මනසට පිළිසරණ සිහිය. එහෙනම් ඔබ ඔබේ පිළිසරණ ඇති කරගන්න තියෙන්නෙ කුමක් මුල් කරගෙන ද? ඔබේ ජීවිතේ තියෙන ප්‍රධාන ම දෙය කුමක් ද? මනස ද? කය ද? ඒ මනසට ඔබට පිළිසරණක් වුවමනා නම් කරන්න තියෙන්නේ සතර සතිපට්ඨානයේ සිහිය පිහිටුවාගන්න එක. මේක බාහිර කෙනෙකුට කරල දෙන්න පුළුවන් දෙයක් නොවෙයි. මේක තම තමන් විසින් තම තමන් තුළ ඇති කර ගත යුතු දෙයක්. ඒක තමයි මේකෙ තියෙන සත්‍ය තත්වය.

## නොසෙල්වෙන පහන් සිල - එක්තැන්ව දිලෙන ලෙස...

ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා සමාධිය ගැන. ඒ කියන්නෙ පංච නීවරණ සිතෙන් යටපත් වෙලා ගිහින් සිතේ ඇතිවෙන ඒකාග්‍රතාවය. දැන් එහෙමනම් අපිට පේනවා අපේ හිතේ පැලපදියම් වෙච්ච දේවල් පහක් තියෙනවා. ඒවට තමයි පංච නීවරණ කියන්නේ. පංච නීවරණ කියන්නේ චිත්ත දියුණුව වලකාලන දේවල් පහක්.

ඒ තමයි බාහිර දේට ආශා කිරීම. අරමුණු සමඟ ගැටීම. ඊළඟට නිදිමත අලස බව. හිතේ විසිරීම. සැකය. මේවා හිත අභ්‍යන්තරයේ නිරන්තරයෙන් ම පැලපදියම් වෙලා තියෙන්නෙ. ඉතින් මේවා බැහැර වෙන ආකාරයට. වීරියෙන් යුක්තව සිහිය පිහිටුවනකොට එයා තුළ සිත එකඟ වීමේ කුසලතාවය වර්ධනය වෙනවා. අන්න ඒකට කියනවා සමාධිය. දැන් බලන්න බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළ කොච්චර දේවල් තියෙනවද?

## ලොවට ම විවර වූ සනාතන දහම

ඉතින් බලන්න බුදුරජාණන් වහන්සේගේ ධර්මයක් අපට මුණ ගැහුනම තියෙන ලාභය. දැන් මේ වගේ ධර්මයක් අහන අපට පුළුවන් ද කෙනෙක්ව රවට්ටලා මේ ධර්මයට ගන්න. රවට්ටලා ගන්න බෑ. මොකද අපි කුණු මාළු ගානට විකුණන්නෙ නැහැ. රත්තරන් රත්තරන් හැටියට සිංහ තෙල් සිංහ තෙල් හැටියට අපි දකිනවා. දැන් බුදුරජාණන් වහන්සේගේ ධර්මය විවෘත එකක්. ඕනෑම කෙනෙකුට විවෘතව මේ ධර්මය කතා බස් කරන්න පුළුවන් එකක්. මේක රහසේ උගන්වන දෙයක් නොවේ. විවෘත වූ දෙයක්. අනික මේක බුද්ධියත් එක්ක සම්බන්ධ දෙයක්. දැන් ඔබට මෙහෙම කතාකරන කොට තේරෙනව ඇති

සිහිය පිහිටුවාගන්න, වීරිය පිහිටුවාගන්න කිව්වම මේකෙ යම්කිසි බුද්ධිමත් බවක් තියෙන්න ඕනෙ.

බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළ සමාධිය දියුණු කරන්න පුළුවන් හැටි සියල්ල මනාලෙස විස්තර වෙනවා. ඒ බුදු රජාණන් වහන්සේගේ බුද්ධ දේශනා වල පමණයි. එතිනින් එපිට සමාධියක් දියුණු කරන ක්‍රමයක් මේ ලෝකේ අවිද්‍යාමාන යි. ලෝකයේ දකින්නට නෑ. ලෝකයේ තියෙන සිත දියුණු කරන ක්‍රමය බුදු රජාණන් වහන්සේගේ ධර්මයේ පමණයි. වෙන තැනක තිබ්බනම් අපි තිබ්බා කියල කියනවා. අන්න අසවල් තැනත් තිබ්බා කියල. ඉතින් ඒ නිසා මේ සමාධිය පළවෙනි ධ්‍යානයට, දෙවෙනි ධ්‍යානයට, තුන්වෙනි ධ්‍යානයට පමණක් නොවෙයි, නිරෝධ සමාපත්තිය දක්වා ම සමාධිය දියුණු කළ යුතු ආකාරය ගැන බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ සඳහන් වෙනවා.

## සමාධිය නැතත් අපේක්ෂාවක් තියෙන්න ඕනෙ.

එතකොට අපි මේ තිසරණයේ පිහිටියාට පස්සේ සිහිය පිහිටන්න ඕනෙ. අපට සමාධිය ගැන අපේක්ෂාවක් තියෙන්න ඕනෙ ම යි. දැන් ඒක මේ වගේ එකක්. ළිඳක් තියෙනවා. අපි පිපාසයෙනුත් ඉන්නවා. ළිඳකුත් තියෙනවා නම්, පිපාසයෙනුත් ඉන්නවා නම්, වතුර ගැන අපේක්ෂාවක් නැද්ද? වතුර ගැන අපේක්ෂාවක් තිබුණොත් තමයි එයා ඒ ළිඳෙන් වතුර බොන්නෙ. අන්න ඒ වගේ තමයි සමාධිය. සමාධිය නැති වුනත් සමාධියක් අපේක්ෂාවෙන් එයා සිහියේ යෙදිලා, ධර්ම මනසිකාරයේ යෙදෙනවා නම්, සමාධි ඉන්ද්‍රියේ බීජ අවස්ථාවේ එයා ඉන්නෙ. අන්න ඒ කෙනාට, ශ්‍රද්ධානුසාරී කෙනාට සමාධි

ඉන්ද්‍රිය යන්තම් තියෙනවා කියන්නෙ ඒකයි. එතකොට සමාධි ඉන්ද්‍රිය පිළිබඳ එයා කල්පනාවක යෙදී සිටිනවා. අන්න ඒ කෙනාට සමාධි ඉන්ද්‍රිය පිහිටන්න පටන් ගන්නවා මෘදු වශයෙන්.

## කූටාගාර ශාලාවේ කැණිමඬල = ශ්‍රී සද්ධර්මයේ ප්‍රඥාව

දැන් ඔබ දන්නා මේ බුදුරජාණන් වහන්සේගේ ශාසනයට ඇතුළු වෙන්න තියෙන්නේ ශ්‍රද්ධාවෙන්. ශ්‍රද්ධාවෙන් ප්‍රවේශ වෙච්ච එක්කෙනා ශ්‍රද්ධාව මුල්කර ගත්තු ප්‍රඥාවෙන් තමයි දියුණු කරලා ගන්නේ.

ඔබ අහලා තියෙනවද කූටාගාර ශාලාව කියල වචනයක්. ඉස්සර විශාලා මහනුවර මහ වනේ කූටාගාර ශාලාවක් තිබිලා තියෙනවා. කූටාගාරය කියලා කියන්නෙ රවුම් ගොඩනැගිල්ලක්. එහෙම නැත්නම් අටපට්ටම් හැඩයෙන් යුක්ත ගොඩනැගිල්ලක්. ඒකේ වහලෙ තියෙන්නෙත් ඒ හැඩේට ම යි. මැද පරාලයක් හැටියට පරාලයක් නෙවෙයි තියෙන්නෙ. වහලේ මුදුනේ තියෙන්නේ ලොකු ලී රවුමක්. ඒ ලොකු ලී රවුමට තමයි පරාල ඔක්කොම වද්දලා තියෙන්නෙ. එතකොට වහලේ මැද කණුවක් නෑ. ඒ උඩ තමයි උළු සෙවිලි කරලා තියෙන්නෙ. ඒකට කියනවා කැණිමඬල කියල. අර කැණිමඬල මුල්කරගෙන තමයි පරාල ඔක්කොම වද්දලා තියෙන්නෙ. එහෙමනම් ඒ වහලේ සම්පූර්ණ බර තියෙන්නේ කැණිමඬලේ. එතකොට ඒ වහලේ ප්‍රධාන අංගය මොකක් ද? කැණිමඬල. අන්න ඒ වගේ තමයි මේ ධර්මයේ ප්‍රඥාව.

එතකොට පින්වතුනි, මේ ප්‍රඥාව කියන්නේ අපි හොඳට තේරුම් ගත යුතු දෙයක්. චතුරාර්ය සත්‍යය ගැන

තියෙන අවබෝධමයි ප්‍රඥාව කියන්නේ. වෙන දෙයක් නොවෙයි. බුදු රජාණන් වහන්සේගේ ධර්මයේ ප්‍රඥාව හැටියට විස්තර වෙන්නෙ, "උදයත්ථ ගාමිණී පඤ්ඤා සම්මා දුක්ඛක්ඛයගාමිණියා". ඒකෙ තේරුම තමයි, මේ අනිත්‍ය දුක්ඛ අනාත්ම ත්‍රිලක්ෂණය බලන මනාකොට දුක් කෙළවර කරන ආකාරයේ දැක්මකින් යුක්ත බව. ඒ කියන්නේ චතුරාර්ය සත්‍යය දර්ශනයෙන් යුක්ත බව. ඒ කියන්නේ මේ අනිත්‍ය වූ, දුක් වූ, ඇස්, කණ ආදී ආයතන, පංච උපාදානස්කන්ධ ආදිය ගැන ඒ ආකාරයෙන් ම දකින්න පුළුවන් කම.

ඊළඟට අනිත්‍ය දේට තමන් ඇලෙනවා. ඒ තුළ තමයි දුක හටගන්නේ කියන එක දකින්න පුළුවන්කම ප්‍රඥාවයි. මේ අනිත්‍ය වූ දේට තියෙන ඇල්ම දුරු වුනොත්, අනිත්‍ය දේ අනිත්‍ය වෙලා අවසන් වෙනවා. ආයෙ ආයෙ සකස් කරනවා, දුකෙන් නිදහස් වෙනවා දකින්න පුළුවන් කම ප්‍රඥාවයි. ඒ යථාභූත ඤාණය දියුණු කර ගැනීම පිණිස මේ ධර්ම මාර්ගය තුළ සීල, සමාධි, ප්‍රඥා වලින් යුතු ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩිය යුතු බව දකින්නට පුළුවන් කම ප්‍රඥාවයි.

## මේකට මේ කරුණු හතර තියෙන්න ම ඕනෙ.

මෙන්න මේවා ශ්‍රාවකයා තුළ ඇතිවෙන්නට ඕනෙ. ශ්‍රාවකයා තුළ ඒවා ඇතිවෙන කොට අන්න එයාට ටිකෙන් ටික තමන්ගේ ජීවිතය තුළ ප්‍රඥාව වර්ධනය වෙනවා. එතකොට පින්වතුනි, මේ ඉන්ද්‍රිය පහ ඇතිවෙන්න වුවමනා කරන ප්‍රධාන කරුණු හතරක් තියෙනවා. තමන්ගේ පැත්තෙන් දෙකයි, බාහිරින් දෙකයි.

බාහිරින් ලැබෙන්නෙ කල්‍යාණ මිත්‍ර සේවනය යි, සද්ධර්ම ශ්‍රවණය යි. ඒවා ලැබුනා ම තමන් තුළ

ඇතිකරගන්න ඕනෙ යෝනිසෝ මනසිකාරය යි, ධම්මානුධම්ම පටිපදාවයි. එහෙම නම් පින්වතුනි, බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේව හඳුන්වලා තියෙන්නෙ කල්‍යාණ මිත්‍රයෙක් හැටියට යි. එහෙමනම් අපිට දකින්නට ලැබිය යුත්තේ කල්‍යාණ මිත්‍රයින් වයි. අසන්නට ලැබිය යුත්තේ ශ්‍රී සද්ධර්මය යි. ඒ දෙක ම ලබාගත්තු එක්කෙනා නුවණින් විමසලා විමසලා තමන්ගේ ජීවිතය තුළ ධම්මානුධම්ම පටිපදාවක යෙදෙනවා.

## තනි තනිව පුරුදු කරගන්න.

දැන් ඔබට කියපු දේ සාරාංශ වශයෙන් මතක තියා ගන්න. අපිට අවශ්‍යයි ධර්ම පහක් ඇතිකරගන්න. මොනවද ඒ? ඒ තමයි ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා. මෙන්න මේ ධර්ම පහ පෞද්ගලිකව ම දියුණු කරන්න ඕනෙ. අන්න එතකොට තමයි තමන්ට මේකේ පැහැදිලි ප්‍රවේශයක් තුළින් සාර්ථකත්වයක් විඳින්නට පුළුවන් වෙන්නෙ. ඉතින් අපි ඒක හරියට තේරුම් ගන්න ඕනෙ.

## ඔක්කොට ම මුල හිත ද? කය ද?

බුදුරජාණන් වහන්සේගේ ජීවිතය ගැන අත්දකින්නට තවත් කාරණයක් මම සිහි කරන්නම්. ඔබ අහලා තියෙනවා නේද නිගණ්ඨනාථ පුත්ත ගැන. එයාගේ ධර්මය තමයි පරම අවිහිංසාවාදය. එයා කිව්වා එළවළුයි බතුයි අනුභව කිරීමෙන් සත්වයා පිරිසිදු වෙනවා කියල. ඒක තමයි නිගණ්ඨ ධර්මය.

ඒකට පැහැදිච්ච කෙනෙක් හිටියා උපාලි කියලා. එයා ඒ කාලෙ සිටුවරයෙක්. ඉතින් බුදුරජාණන් වහන්සේගේ බණ පදයක් මෙයාට ආරංචි වුණා. ඒ තමයි

මනස ප්‍රධානයි කියල. උපාලි ඉස්සරහා හිටියා දීඝ තපස්සී කියල කෙනෙක්. එයා තමයි මේ පණිවිඩය ගෙනාවෙ. " මොන පිස්සුද මනස කොහෙද ප්‍රධාන වෙන්නෙ? කය මුල්කරගෙන නෙ මේ ඔක්කොම කරන්නෙ" කියලා මෙයා කියන්න ගත්තා. ඉතින් උපාලි මෙහෙම කිව්වා. "හා... එහෙම කොහොමද? මං අල්ලගන්නම්. දිග ලොම් තියෙන එළුවෙක් ව අල්ලගෙන ඒ ලොම් වලින් අල්ලලා හිට කරකවලා කරකවලා වීසිකරලා පැත්තකට දානවා වගේ මං ශ්‍රමණ ගෞතමයන්ව පැත්තකට දාලා වට්ටවනවා" කියල. එතකොට නිගණ්ඨනාථ පුත්ත කිව්වා. "පලයන් පුතා, බය නැතිව ගිහින් සටන කරපන්" කියල. ඒ වෙලාවෙ දීඝ තපස්සී කිව්වා "යන්න එපා, ශ්‍රමණ ගෞතමයන් ගාව ඉණා බෙහෙත් තියෙනවා. අල්ලගනියි" කියල. "මොන ඉණා ද? පලයන් යන්න" කියල එයාව එලෙව්වා.

ඊට පස්සේ උපාලි ගෘහපතියා ගිහිල්ලා ඇහුවා බුදුරජාණන් වහන්සේගෙන්. සාකච්ඡාව පටන් ගත්තා. මේක හරිම බුද්ධිමත් සාකච්ඡාවක් බවට පත්වුනා. බුදුරජාණන් වහන්සේ හරි ම ලස්සනට කරුණු කිව්වා, මනස ප්‍රධානයි කියල. එහෙම කියපු ගමන් ම උපාලිට තේරුණා තමන් දරපු මතය සම්පූර්ණයෙන් ම වැරදියි කියල. මේ මතය උගන්වපු නිගණ්ඨනාථ පුත්තට තියෙන්නේ එළවළුයි බතුයි විතරයි. ප්‍රඥාවක් නැහැ කියල. ඊට පස්සෙ එකපාරට ම නිගණ්ඨනාථ පුත්ත බැහැර කරලා, "භාග්‍යවතුන් වහන්ස, මම බුදුරජාණන් වහන්සේව සරණ යනවා. මං ඒ ධර්මයත් සරණ යනවා, ඒ ශ්‍රාවක සංඝරත්නයත් සරණ යනවා" කියල කිව්වා.

බුදුරජාණන් වහන්සේ හරි අපූරු උත්තරයක් ඒ වෙලාවෙ දුන්නා. "උපාලි ගෘහපතිතුමනි, ඔබ බොහොම

ප්‍රසිද්ධ කෙනෙක්. ඔබ එක පාරට ම ඔහොම තීරණ ගන්න එපා." එතකොට උපාලි ගෘහපතිතුමා කියනවා, "අනේ ස්වාමීනී, හරි ම ආශ්චර්ය යි. මං වෙන ආගමකට ගියානම් ඒ මිනිස්සු මාව පිළිගන්න තොරණ් ගහනවා. මාව පිළිගන්න බැනර් ගහනවා. මට මල් මාලා දානවා. ඔබ වහන්සේ හාත්පසින් ම වෙනස් එකක් කියන්නෙ. ඔබ වහන්සේ කියනවා කල්පනා කරන්නලු තව. මම ඒ නිසා තවත් ඔබවහන්සේ ගැන පැහැදුනා. භාග්‍යවතුන් වහන්ස, දෙවෙනි වතාවටත්, මම ඔබ වහන්සේව සරණ යනවා." කියල සරණ ගියා.

එතකොට බුදුරජාණන් වහන්සේ කියනවා " එහෙමනම් උපාලි, ඔබේ මාලිගාව මේ නිගණ්ඨ ශ්‍රාවකයන්ට පැන් පොකුණක් වගේනෙ තිබුනේ. ඔබ ගොඩක් උදව් කරපු කෙනෙක් නෙ. ඒ නිසා ඔබ ඒ නිගණ්ඨ ශ්‍රාවකයන්ට පරණ විදිහට ම සලකන්න" කියල. එතකොට උපාලි ගෘහපතිතුමා කියනවා, "ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, හරිම පුදුමයි. මම වෙන ආගමකට ගියා නම් ඒ මිනිස්සු කියන්නේ අපට විතරක් සලකපන්. අරුන්ට සලකන්න එපා කියලයි. මෙතන හාත්පසින් ම වෙනස් එකක්නේ භාග්‍යවතුන් වහන්සේ වදාළේ. මම භාග්‍යවතුන් වහන්සේව තුන්වෙනි වතාවටත් සරණ යනවා" කියලා ආයෙමත් බුදුරජාණන් වහන්සේව සරණ ගියා.

## සැබෑ රැකවරණය ලබා ගන්න

බලන්න ශාස්තෘත්වය කොයිතරම් පිරිසිදුයි ද? නිර්මලයි ද? කියල. ඉතින් ඒ නිසා එබඳු ශාසනයකට පැමිණි අපිත් පහදින්න ඕනෙ බුදුරජාණන් වහන්සේ ගැන.

බුදුරජාණන් වහන්සේගේ ධර්මය ගැන. ශ්‍රාවක සංඝරත්නය ගැන. වීරිය ඇතිකරගන්න ඕනෙ. සිහිය පිහිටුවා ගන්න ඕනෙ. සමාධිය දියුණු කරගන්න ඕනෙ. ප්‍රඥාව දියුණු කරගන්න ඕනෙ. එතකොට අපිට පුළුවනි මේ ඉන්ද්‍රිය ධර්ම දියුණු කරගෙන අපේ හිතමිතුරන්ට යාළු මිත්‍රාදීන්ට නෑදෑයින්ට මේ ඉන්ද්‍රිය ධර්ම දියුණු කරගන්න හැටි කියල දීලා ඒ අයටත් මෙලොව පරලොව රැකවරණය ලබා දෙන්න.

දැන් මේ ඉන්ද්‍රිය ධර්ම අප තුළ තියෙද්දි අපි මැරුණා. කොහේ උපදියි ද? ස්ථිරව ම සුගතියේ. එතකොට බලන්න නො පිරිහුණු සන්තානයකින් මෙලොව ජීවිතය ගත කිරීමටත්, ඒ නො පිරිහුණු චිත්ත සන්තානයෙන් මරණයට පත්වීමෙන්, සුගතියේ ඉපදීමටත් උපකාර වෙන්නේ මේ ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, ප්‍රඥා කියන ඉන්ද්‍රිය ධර්මයන්. ඒ නිසා මේ ඉන්ද්‍රිය ධර්මයන් ඔබගේ චිත්ත සන්තානයේ වර්ධනය කරගෙන මේ උතුම් ගෞතම බුද්ධ ශාසනයේ දී ම උතුම් චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ වේවා!

**සාදු! සාදු!! සාදු!!!**